# සාතන් සහ ක්‍රිස්තුස්



සම්පාදනය: වොට්සන් ගුඩ්මන්

නොමිලේ - විකිණීමට නොව

# සාතන් සහ ක්‍රිස්තුස්

දේව වචනයේ ‘‘මෙලොව දෙවියා’’ සේ විස්තර කර ඇති සාතන්, දෙවියන්වහන්සේගේද, දෙවියන්වහන්සේගේ උත්තම මැවිල්ල වන මිනිසාගේද, පරම සතුරාය. මනුෂ්‍යයන් වන අප සිටිනුයේ දරුණු යුද බිමකය. **ක්‍රිස්තුස්වහන්සේ** හා සාතන් අතර යුද්ධය, තියුණුව පැතිර ඇත. මේ දෙදෙනාගෙන්, අප සදාකාල පුද්ගලික ස්වාමියා කවුරුද යන් අප තෝරාගත යුතුයි. එනම්, එම්මානුවෙල් (දෙවියන්වහන්සේ අප සමගය) වන මැවුම්කරු **ක්‍රිස්තුස්ද** නැතහොත් දෙවියන්වහන්සේට විරුද්ධව ඇති සියලුම කැරළිවල දෙවියා, සාතන් වන මැවිල්ලද. උන්වහන්සේ කෙරෙහි සැබවින් විශ්වාස කරන සියල්ලන් උදෙසා සර්ව ජය, උන්වහන්සේගේ මරණින් හා නැවත නැගිටීමෙන් **ක්‍රිස්තුස්වහන්සේ** ලබා දුන්සේක.

මිනිසාව රැවටීමට හා නොමග යැවීමට සාතන් නොයෙක් ක්‍රමවලින් වෑයම් කරයි. අවසාන ප්‍රතිඵලය, නමස්කාරය වේ. සියලු නමස්කාර ලැබීමට සුදුසු අප මැවුම්කරු **ක්‍රිස්තුස්වහන්සේය**. අප නමස්කාර කරන තැනැත්තා හා අපව අඳුනනු ලබයි. ලෝ පැතිර සිටින මිනිසාව යටත් කිරීම පිණිස සාතන්ගේ අන්තිම උත්සහාය මධ්‍යස්ථ වී තිබෙනුයේ : 1. දෙවියන්වහන්සේගෙන් නිදහස් කිරීම 2. යක්ෂයන්ට කීකරු කිරීම 3. ‘‘පාපයේ මිනිසාට’’ නමස්කාර කරවීම 4. තම ‘‘රූපය’’ නමස්කාර කරවීම සහ 5. මිළයට ගැනීමට හෝ විකිණීමට හැකි, ශරීරය මත ලකුණ. ඒ සියල්ලෙන් ප්‍රවේසම්වෙන්න!

වොට්සන් ගුඩ්මන්

# දෙවිතුමා විරුද්ධවාදියෙකු මැවූයේ නැත 

### ස්වර්ගයේ අති උසස් ස්ථානයක් පිණිස දෙවියන්වහන්සේ ලුසිෆර්ව මැවූහ

එසකියෙල් 28 : 12 ආ-16

ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියසේක: නුඹ සම්පූර්ණකම මුද්‍රා කරන්නාව ප්‍රඥාවෙන් පිරී, ලස්සනින් සර්වසම්පූර්ණව සිටියි. නුඹ දෙවියන්වහන්සේගේ උයන වන ඒදන්හි සිටියේය; සියලු අනගි ගල් වන ලෝහතංකද, පුෂ්පරාගද, වජ්‍රද, රන්කාන්තිද, නබමාණික්‍යද, සූර්‍ය්‍යකාන්තිද, නීලමාණික්‍යද, රන්ද, නුඹේ වැස්මට තිබුණේය. නුඹේ රබන්වලද, නුඹේ නළාවලද මෙහෙවර නුඹ තුළ විය; නුඹ මවනු ලැබූ දවසේ දී ඒවා සූදානම් කරන ලදී.

### දේව සිංහාසනය අසළ සිටියේය

නුඹ පියාපත් විදහාගෙන සිටින ශෙරුබයෙකි; මම නුඹව එසේ තැබුවෙමි. දෙවියන්වහන්සේගේ ශුද්ධ කන්දෙහි නුඹ සිටියේය, ගිනි ඇවිලෙන ගල් අතරේ නුඹ ඇවිද්දේය.

### සර්වසම්පූර්ණව මවන ලදී

නුඹව මැවූ දින සිට, නුඹ තුළ අධර්මිෂ්ඨකම සම්භවෙන තුරු, නුඹේ මාගර්වල නුඹ සම්පූර්ණව සිටියේය.

### දෙවියන්වහන්සේ පාපය පහ කරති

නුඹේ වෙළඳමේ …… මනුෂ්‍යයෝ නුඹ මධ්‍යයේ බලහත්කාරකම් පිරවූහ; නුඹ පව් කළේය. එබැවින්, කෙලසුණු දෙයක් සේ, මම නුඹව දෙවියන්වහන්සේගේ කන්දෙන් පහකර දමමි. පියාපත් විදහා සිටින ශෙරුබයෙනි, ගිනි ඇවිලෙන ගල් අතරින් මම නුඹව විනාශ කරමි.

# පව් කිරීමට දුසිප්ව පෙළඹුවේ කුමක්ද?

හිතෝපදේශ 16 : 18

විනාශයට පෙර උඩඟුකමද, වැටීමට පෙර අහංකාර සිතද වෙයි.

එසකියෙල් 28 : 17 - 19

නුඹේ රුව නිසා නුඹේ සිත උඩඟු වී තිබේ; නුඹේ දීප්තිකම නිසා නුඹේ ප්‍රඥාව දූෂණය කරගත්තේය. මම නුඹව පොළොවට හෙළා, රජවරු නුඹව දකින පිණිස, නුඹව ඔවුන් ඉදිරිපිට තැබුවෙමි.

### කැරලිකරුගේ අවසානය

නුඹේ වෙළඳමේ අධර්මිෂ්ඨකමින් කළ නුඹේ අපරාධ රාශියෙන්, නුඹ නුඹේ ශුද්ධස්ථාන කෙලසීය; එබැවින්, නුඹ මධ්‍යයේ මම ගින්නක් නික්මවමි; එය නුඹව විනාශ කරන්නේය; නුඹව දකින සියල්ලන්ගේ නෙත් ඉදිරිපිට, පොළෝ මත නුඹව අළු කරමි. මිනිසුන් අතරේ නුඹව අඳුනන සියල්ලෝම නුඹ ගැන විස්මයට පත්වෙති. නුඹ බිහිසුනුව සිටින්නේය, නුමුත් තවත් නුඹ නොපවතින්නේය.

### සියලුම මැවීම්, මැවුම්කරුට අවනත විය යුතුයි

ගීතාවලිය 100 : 2, 3

ප්‍රීතියෙන් ස්වාමීන්වහන්සේට සේවය කරන්න; ගීතිකා කරමින් උන්වහන්සේ ඉදිරියට එන්න. ස්වාමීන්වහන්සේ දෙවියන්වහන්සේ බව දැනගන්න. අපව මැවූයේ උන්වහන්සේය, නුමුත් අපව, අප නොව. අප උන්වහන්සේගේය; අප උන්වහන්සේගේ සෙනඟය, උන්වහන්සේගේ ගොදුරුබිමේ බැටළුවන්ය.

## දේව කැමැත්තට විරුද්ධව ඔහුගේ කැමැත්ත

යෙසායා 14 : 12 - 19

අහෝ ලූසිපර්, අලුයම් පුත්‍රය, නුඹ ස්වර්ගයෙන් වැටුණු සැටි! ජාතීන් හෙළාදැමූ නුඹ, බිමට සිඳ දමූ සැටි! මම ස්වර්ගයට නගිමි; මම මාගේ සිංහාසනය දෙවියන්වහන්සේගේ තාරකාවලට උඩින් තබමි. උතුරේ ඉතා ඈත සීමාවල ඇති රැස්වීමේ කන්ද මත මම ඉඳගන්නෙමි. වළාකුල් මුදුන් පසු කර, මම ඉහළට නගින්නෙමි; මම මහෝත්තමයාණන්ට සමාන වන්නෙමියි, නුඹ සිතින් කීය.

## පොළෝ මත විනාශය ඇති කරයි

එහෙත් පාතාලය නම් වළේ ගැඹුරටම නුඹව දමනු ලැබේ. නුඹව දකින්නෝ, නුඹ දෙස වුවමනාවෙන් බලා, කල්පනා කර: පොළොව වෙවුලවා, රාජ්‍යයන් සොලවා, ලෝකය කාන්තාරයක් සේ කර එහි නුවරවල් නාස්ති කළාවූ, සිය සිරකරුවන්ව නිවෙස්වලට යන්ට නැරී මිනිසා මොහුදැයි කියන්නෝය.

## ඔහු දෙවියන්වහන්සේට පිළිකුලකි

ජාතීන්ගේ රජවරු සියල්ලෝම ගෞරවයෙන් යුතුව එකිනෙකා තම තමාගේ ගෘහයේ සැතපී සිටිති. නුමුත්, නුඹ පිළිකුල් අත්තක් මෙන්ද, කඩුවෙන් ඇන මැරුම් කෑ, වළේ ගල්වලට බසින්නන්ගේ වස්ත්‍ර මෙන්ද ... නුඹේ සොහොන් ගෙයින් පිටත විසිකරනු ලැබේ.

# දෙවිතුමාගෙන් නිදහස්වීම භයානකය

### පළමුව ලුසිපර් තුළ

(තෙවන පිටුවේ යෙසායා 14: 13, 14
ලුසිපර්ගේ පස් "මම" (මමත්වය) බලන්න)

ලූක් 10 : 18

සාතන් විදුලිය මෙන් අහසෙන් වැටුණා දුටුමියි උන්වහන්සේ ඔවුන්ට කීසේක.

### සාතන්ගේ අනුගාමික දේවදූතයන් තුළ

2 පේත්‍රුස් 2 : 4

දේවදූතයන් පව් කළ විට, දෙවියන් වහන්සේ ඔවුන්ට දඬුවම් නොකර නැර නිරයෙහි හෙලා, විනිශ්චයට වෙන්කර තැබීමට අන්ධකාරයේ ගුහාවට භාරදුන්හ.

### සාතන්ට රැවටීමට හැකි මිනිසා තුළ

1 තිමෝති 3 : 6

ඔහු උඩඟු වී, යක්ෂයාට පැමිණි දඬුවමට නොවැටීම පිණිස ආධුනිකයෙක් නොවිය යුතුයි.

### සාතන් මිනිසාව පාලනය කරයි

2 පේත්‍රුස් 2 : 19 ආ

.........යමෙක්, යමෙකුගෙන් පරාජය වූ විට, ඔහු ඒ තැනැත්තාට වහල්ව සිටියි.

### එකම කැමැත්තක් පමණක් ස්වර්ගයට තිබිය යුතුය - සර්වපූර්ණ දේව කැමැත්ත

රෝම 12 : 2

නුඹලා මෙලෝ ක්‍රමයට සමාන නොවී, දේව කැමැත්ත, එනම්: යහපත්, පිළිගත යුතු, සම්පූර්ණ දෙය කුමක්ද කියා දැන-ගන්නා පිණිස, සිත අලුත් කරගැනීමෙන් අනායාකාර අය වෙන්න.

...........එකිනෙකාට සදහටම ද්වේශ කරන "කැමැත්තන්" කෝටිගණනින් අපායේ ඇත.

විතීය 5 : 6, 7

මිසර දේශය වන වහල්කමේ නිවසින් නුඹව පිටත ගෙනා නුඹේ දෙවි වූ ස්වාමීන් මමය. මා ඇර, අන් දෙවිවරු ඇතිව නොසිටින්න.

1 ලේකම් 16 : 29

ස්වාමීන්ගේ නාමයට අයිති ගෞරවය දෙන්න. පඬුරක් රැගෙන උන්වහන්සේ ඉදිරියට එන්න. ශුද්ධ වූ අලංකාරය ඇතිව ස්වාමීන්ට නමස්කාර කරන්න.

මතෙව් 4 : 10

එවිට යේසුස්වහන්සේ: සාතන් අහක්ව යව. ඔබගේ දෙවි වූ ස්වාමීන්ට නමස්කාර කරන්න; උන්වහන්සේට පමණක් සේවය කරන්න කියා ලියා තිබේ යයි කීසේක.

එළිදරව් 19 : 10 ආ

ඔහුට නමස්කාර කිරීමට මම ඔහුගේ (දේව දූතයාගේ) පාමුල වැටුනෙමි. ඔහුද: එසේ නොකරන ලෙස බලාගන්න. මම ඔබේද, යේසුස්වහන්සේගේ සාක්ෂිය දරන ඔබේ සහෝදරයන්ගේද, හවුල් මෙහෙකරුවෙක්ය. දෙවියන්වහන්සේට නමස්කාර කරන්න.

ගීතාවලිය 95 : 6

එන්න, නමස්කාර කරමින් අපි වැඳ වැටෙමු; අපේ මැවුම්කාර ස්වාමීන් ඉදිරියේ දනගසමු.

## රූවටෙන්නෝ කැරළිකරුව නමස්කාර කරති

එළිදරව් 13 : 3 ආ, 4 අ

මුළු ලෝකයා මෘගයා පසුපස පුදුමව ගියහ; මහා සර්පයා මෘගයාට බලය දුන් නිසා, ඔහු මහා සර්පයාට නමස්කාර කළහ.

# දෙවියන්වහන්සේගේ විරුද්ධවාදින්ට නමස්කාර නොකරන්න!

## සාතන් හා යක්ෂයන් නමස්කාරයට බලවත් සේ ප්‍රිය කරති

මතෙව් 4 : 8, 9

නැවතත් යක්ෂයා, උන්වහන්සේව ඉතා උස් කන්දකට පමුණුවා, ලොව සියලු රාජ්‍යයන්ද, එහි ඓශ්වර්‍ය්‍යයද උන්වහන්සේට පෙන්වා: ඔබ බිම වැටී, මට නමස්කාර කරත් නම්, මේ සියල්ල ඔබට දෙමියි උන්වහන්සේට කීය.

එළිදරව් 9 : 20

මේ වසංගතවලින් මරනු නොලත් ඉතිරි මනුෂ්‍යයෝද, යක්ෂයන්ටත්, දකින්ට අසන්ට හෝ ඇවිදීමට නුපුළුවන් රන්රිදී, පිත්තල, ගල් ලී, රූපවලටත් නමස්කාර නොකරන ලෙස, සිය අත්වල කර්මාන්ත ගැන පසුතැවිලි නූණෝය.

## එවැනි නමස්කාර කරන්නන්ව දෙවියන්වහන්සේ විනාශ කරති

එළිදරව් 16 : 2 ආ සහ 20 : 13 ආ, 14

එවිට මෘගයාගේ ලකුණ ඇත්තන්ද, ඔහුගේ රූපයට නමස්කාර කරන්නන්ද කෙරෙහි වස අරිෂ්ට වණ හටගැනින...... ඔවුහු එකිනෙකා තම තමාගේ ක්‍රියා අනුව විනිශ්චය කරන ලදහ. මරණයත්, පාතාලයත් ගිනිවිලට හෙළන ලැබුවේය. මෙය දෙවන මරණයයි.

යෙසායා 42 : 8

මම ස්වාමින්ය. එය මාගේ නාමයයි. මාගේ ගෞරවය වෙන කෙනෙකුටවත්, මාගේ ප්‍රසංසාව රූපවලටත් නොදෙමි.

# ක්‍රිස්තුස්වහන්සේගේ දූතයන් හා සාතන්ගේ දූතයන් 

**පහත හෙලූ සාතන්ගේ දූතයන්ට වඩා ස්වාමින්ගේ දූතයන් බලසම්පන්නය**

උන්වහන්සේගේ වචනයේ හඬ අසා, උන්වහන්සේගේ පනත් රකින්නා වූ, ශක්තියෙන් බලසම්පන්න ස්වාමින්ගේ දූතයෙනි, උන්වහන්සේට ප්‍රසංසා කරව්.
—ගීතාවලිය 103 : 20

තවද ස්වර්ගයෙහි යුද්ධයක් විය. මිකායෙල් හා ඔහුගේ දූතයන් මහා සර්පයාට එරෙහිව සටන් කළහ. මහා සර්පයාද සිය දූතයෝද සටන්කර ජය නොලැබුහ.
—එළිදරව් 12 : 7

**ශුඬ දේවදූතයන් ස්වාමින්ගේ මනුෂ්‍යයන්ට සේවය කරමින් ආරක්ෂා කරති**

ඔවුන් සියල්ලන්, ගැලවීම උරුම කර ගැනීම පිණිස සිටින්නන් උදෙසා සේවය කිරීමට එවනු ලැබූ සේවක ආත්මයන් නොවේද? —හෙබ්‍රෙව් 1 : 14

ඔබේ සියලු මාර්ගවලදී, ඔබව ආරක්ෂා කරණ පිණිස, ඔබ ගැන සිය දූතයන්ට, උන්වහන්සේ අණදෙනසේක.
—ගීතාවලිය 91 : 11

**පහත හෙලූ දූතයන් (යක්ෂයන්) මිනිසාව අපාගත කිරීමට දැඩි ලෙස ක්‍රියා කරති**

...තමාට වඩා නපුරු, වෙන ආත්ම සතක් තමා සමග ගෙන එයි.... —ලූක් 11 : 26 අා

පසුකාලයේදී, මුළාකරන ආත්ම හා යක්ෂයාගේ ගුරුකම් සළකා, සමහරු ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන් පැහැදිලිව කියති.
—1 තිමෝති 4 : 1

# සාතන් විශේෂයෙන් වෛර වෙන්නේ කාහටද කුමකටද

### දේව ස්වරූපයට මැවූ මිනිසාට

ඔහු එන විට, යක්ෂයා ඔහුව බිම හෙළා, ඔහුට බොහෝ සේ පීඩා කළේය. නුමුත් යේසුස්වහන්සේ අශුද්ධාත්මයට තරවටු කර, දරුවා සුවකර, පියාට ඔහුව නැවත භාර දුන්හ. —ලූක් 9 : 42

### දේව ආසිරි ඇති පවුල්වලට

තවද ඔබට ආශීර්වාද කරන්නන්ට මම ආශීර්වාද කරමි; ඔබට සාප කරන්නන්ට සාප කරමි. පොළොවේ සියලු පවුල් ඔබ තුළින් ආශීර්වාද ලබන්නෝය.

—උත්පත්ති 12 : 3

### ක්‍රිස්තුස්වහන්සේ (දෙවියන්වහන්සේ මාංසයෙන්) හා උන්වහන්සේගේ පුද්ගලිකත්වය තුළ ගැලවීමට හා දිව්‍ය ලෙයට

එකල හෙරොද් ... ඉතා උදහස්ව, ඔවුන්ගෙන් නිසි ලෙස දැනගත් කාලය අනුව, මනුෂ්‍යයන් යවා බෙත්ලෙහෙමෙහි.. සිටි දෑ අවුරුදු වයසැති හා ඊට බාල සියලු පිරිමි ළමුන් මැරුවේය. —මතෙව් 2 :16

### දේව වචනයට - සාතන්ගේ විරෝධය

දෙවියන්වහන්සේ කීවාද ... ඇත්තෙන්ම ඔබලා නසින්නේ නැත... සර්පයා ස්ත්‍රියට කීය. — උත්පත්ති 3: 1 ආ, 4

### ආත්මිකව උත්පාදවූ ඇදහිලිවන්තයින්ට

...ඔබලගේ විරුද්ධකරු වන යක්ෂයා... කවරෙකු ගිලගනිම්දැයි සොයමින් ඔබ-මොබ ඇවිදියි. —1 පේත්‍රුස් 5 : 8

**අයිතිවාසිකමේ ලකුණ අනුකරණය කරයි**

එළිදරව් 22 : 3, 4

කිසි සාපයක් තවත් නොවන්නේය. දෙවියන්වහන්සේගේද, බැටළුපැටවාණන්ගේද සිංහාසනය එහි වෙයි. උන්වහන්සේගේ සේවකයෝ උන්වහන්සේට සේවය කරති; ඔවුහු උන්වහන්සේගේ මුහුණ දකිති; උන්වහන්සේගේ නාමයද ඔවුන්ගේ නළලේ තිබෙන්නේය.

**ශුභාරංචිය බොරුවෙන් මිථ්‍යාදෘෂ්ටියට හරවයි**

ගලාති 1 : 6, 7

ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාව තුළින් ඔබව කැඳවූ තැනන්වහන්සේ කෙරෙන් ඔබ මෙපමණ ඉක්මනින් අන්‍ය ශුභාරංචිය කට හැරී යනවට මවිත වෙමි. සමහරු ඔබ කලඹා ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය මිථ්‍යාදෘෂ්ටියට හරවන්ට කැමතිය; එය වෙන ශුභාරංචියක් නොව.

**දේව සේවකයන්ව අනුකරණය කරයි**

2 කොරින්ති 11 : 13, 14

එබන්දෝ බොරු ගෝලයෝය; ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන්ගේ වෙස් ගන්නා වංචාකාර සේවකයෝය. එය පුදුමයක් නොව, මක්නිසාද, සාතන්ද ආලෝකයේ දූතයකුගේ වෙස් ගනියි.

**දේව හාස්කම් හා මුසාවාද මවිතයන්**

2 තෙස: 2 : 9 ; එළිද 13 : 13, 14 ; 19 : 20

**කෙනෙකු ක්‍රිස්තුව සැබැවින් නමස්කාර කිරීමේදී, උන්වහන්සේ ඔහුව පාලනය කරනා සේ, සාතන්ව හෝ ඔහුගේ දෙවිදේවතා නමස්කාර කරන්නව ඔහු පාලනය කරයි**

යෙසායා 26 : 13 අ

අපේ දෙවි වූ ස්වාමිනි, ඔබ හැර අන් ස්වාමිවරු අපව ආණ්ඩු කළහ.

# රූපවලින් ඈත් වෙන්න

1 යොහාන් 5 : 21

ප්‍රිය දරුවෙනි, රූපවලින් ඈත් වෙන්න.

නික්මයාම 20 : 3 - 5 අ

මා ඇර වෙන දෙවිවරු ඔබට නොසිටිය යුතුයි. නෙලූ රූපයක් හෝ උඩ අහසෙහි වත්, පහත පොළොවෙහිවත්, පොළොවෙන් යට ජලයෙහිවත් ඇති කිසිම දෙයක සමානත්වයක් හෝ ඔබට සාද නොගන්න. ඊට නමස්කාර නොකරන්න. සේවය නොකරන්න.

**අන් දෙවිදේවතා දෙවියන්වහන්සේට පිළිකුලකි. මිනිස් පූජා තහනම්ය**

විතීය 12 : 2 සහ 30 අ, 31

ඔබ අල්ලාගන්නා ජාතීන් විසින් උස් කඳු පිටද, හෙල් පිටද, සියලු අමු ගස් යටද, සිය දෙවිවරුන්ට සේවය කළ සියලු ස්ථාන සම්පූර්ණයෙන් විනාශ කරන්න... ඔවුන් ඔබ ඉදිරියෙන් විනාශ කළ පසු, ඔබ ඔවුන් අනුව යෑමට අසු නොවන හැටියට වග බලාගන්න... ඔබේ දෙවි වූ ස්වාමීන්ට, ඔබ එසේ නොකළ යුතුයි. මක්නිසාද, ස්වාමීන්වහන්සේ ද්වේශ කරන, පිළිකුල් කරන දෙය ඔව්හු සිය දෙවිවරුන්ට කළහ; ඔවුන්ගේ පුත්‍රයන්ද, ඔවුන්ගේ දූවරුන්ද, ඔවුන්ගේ දෙවිවරුන්ට ගින්නෙන් දවා පූජා කළහ.

මීකා 6 : 7 ආ

මාගේ ආත්මයේ පාපයට, මාගේ ශරීරයේ ඵලය දෙම්ද?

**ක්‍රිස්තුස්ගේ ලෙය පාපය සෝදහරියි**

## රූප වැඳීමේ අඥානකම

රෝම 1 : 25

...ඔවුහු දෙවියන්වහන්සේගේ සත්‍යය බොරුවට හරවා, මැවුම්කරුට වඩා මැවිල්ලට නමස්කාර කරමින් සේවය කළහ. උන්වහන්සේ සදකල්හිම ප්‍රසංසනීයව සිටිති.

ගීතාවලිය 115 : 3 - 8

අපේ දෙවියන්වහන්සේ ස්වර්ගයෙහිය. උන්වහන්සේ කැමති දෙය කළසේක. ඔවුන්ගේ දේවතාරූප රන් රිදිය, මිනිස් හස්ත කර්මාන්තයන්ය. ඒවාට කට වල් ඇත, එහෙත් කථා නොකරති; ඇස් ඇත, එහෙත් නොදකිති; කන් ඇත, එහෙත් නොඅසති; නාස් ඇත, එහෙත් ගඳ සුවඳ නොදනිති; අත් ඇත, එහෙත් නාල්ලති; පා ඇත, එහෙත් නොඇවිදිති; උගුරෙන් කථා නොකරති. ඒවා සාදන්නෝත්, ඒවා කෙරෙහි විශ්වාස තබන්නෝත්, ඒවාට සමානවෙති.

## රූප වැඳීම, යක්ෂයන් වැඳීමයි

1 කොරින්ති 10 : 14ආ සහ 20

...රූප වැඳීමෙන් පලා දුවන්න... මිථ්‍යාදෘෂ්ටියන් පූජා කරන දෙය ඔවුන් පූජා කරන්නේ දෙවියන්වහන්සේට නොව යක්ෂයන්ට බව කියමි. නුඹලා යක්ෂයන් හා සහභාගිව සිටිනවාට අකමැත්තෙමි.

## රූප වැඳීමේ දඬුවම

එළිදරව් 21 : 8 ආ

...රූප වඳින්නන්ට... ගින්නෙනුත්, ගෙන්දගම්නුත් දැවෙන විලෙහි සිය කොටස වෙයි. එය දෙවන මරණය වෙයි.

# රූප (යක්ෂයන්) වැඳීම දෙවියන්වහන්සේ පිළිකුල් කර ඇත

**රූප නිසා, දෙවියන්වහන්සේ ජාතීන් විනාශ කළහ-ඔබ නිවසේ රූප තිබේද!**

විතීය 7 : 24 - 26 අ

ඔවුන්ගේ රජවරුව උන්වහන්සේ ඔබ අතට පාවා දෙනවා ඇත. ඔබ ඔවුන්ගේ නාමය අහස යටින් විනාශ කළ යුතුයි. ඔබ ඔවුන් විනාශකර දමන තුරු, කිසි මිනිසෙකුට ඔබට විරුද්ධව සිටීමට නොහැකිය. ඔවුන්ගේ දෙවිවරුන්ගේ රූප ඔබ ගින්නෙන් දවාලිය යුතුයි... එමන්ද ඒවා ඔබ දෙවි වූ ස්වාමින්ට පිළිකුලකි. පිළිකුල් දෙයක් ඔබගේ නිවසට ගෙන ගොස්, ඒවාට සමාන වී, සාපයට කැප නොවෙන්න....

**ක්‍රිස්තුස්ගේ සේවයේදී, දෙවිතුමා තෝරාගත් ජාතියේ, බොහෝ අය යක්ෂාවේෂ වූයේ ඇයි? ඔවුන්ගේ මුතුන්මිත්තන් යක්ෂයන් නමස්කාර කළ නිසාය**

ගීතාවලිය 106: 36, 37 සහ 40

ඔවුහු ඔවුන්ගේ රූපවලට සේවය කළහ ඒවා ඔවුන්ට මලපතක් විය. එසේය, ඔවුහු සිය දූ පුතුන්ද යක්ෂයන්ට පූජා කළහ. එබැවින් ස්වාමින්ගේ උදහස සිය සෙනඟට විරුද්ධව ඇවිලින. උන්වහන්සේ සිය උරුමයට පිළිකුල් කළහ.

නික්මයාම 20 : 5

ඔබ ඒවාට නමස්කාර නොකරන්න; සේවය නොකරන්න. මක්නිසාද, ඔබේ දෙවි වූ ස්වාමින් වන මම අන්‍යභක්තිය නොඉවසමි. මට වෛර වෙන්නන්ගේ තුන්වන සතරවන පරම්පරාව දක්වා, පියවරුන්ගේ අපරාධ නිසා, දරුවන්ට විපාක දෙමි.

### නික්මයාම 22 : 18

මායාකාරියෙකුට ජීවත්වෙන්න ඉඩ නාරින්න.

### මීකා 5 : 12

මම නුඹේ අතින් මායම් සිඳ දමන්නෙමි; පේන කියන්නෝ තවත් නුඹට නොසිටින්නෝය.

### 1 සාමුවෙල් 15 : 23

මක්නිසාද කැරලිකාරකම පේන කීමේ පාපයටත්, මුරණ්ඩුකම දේවතා හා රූප ඇදහීමටත් සමානය. නුඹ ස්වාමින් වහන්සේගේ වචනය පහ කළ නිසා, උන්වහන්සේ, නුඹව රජකමෙන් පහ කළසේකැයි කීය.

### විතීය 18 : 9 - 12

ඔබේ දෙවි වූ ස්වාමින්වහන්සේ ඔබට දෙන දේශයට ඔබ පැමිණි විට, ඒ ජාතීන්ගේ පිළිකුල් ක්‍රියා කරන්ට ඉගෙන නොගන්න. සිය පුත්‍රයා හෝ දුව ගිනි මැදින් යවා පූජා කරන්නෙක් හෝ පේන කියන්නෙක් හෝ නිමිති බලන්නෙක් හෝ ශාස්ත්‍ර කියන්නෙක් හෝ මායාකාරයෙක් හෝ මතුරන්නෙක් හෝ ආත්ම බන්ධනකාරයෙක් හෝ අනවිනකාරයෙක් හෝ මළවුන්ගෙන් විචාරන්නෙක් හෝ ඔබ අතරේ නොසිටීවා. මක්නිසාද මේ දෙය කරණ කවරෙකු හෝ ස්වාමින්-වහන්සේට පිළිකුලක්ය. මේ පිළිකුල් දේවල් නිසා, ඔබේ දෙවි වූ ස්වාමින් වහන්සේ ඔබ ඉදිරියෙන් ඔවුන් පන්නා දමනසේක.

# යක්ෂාධාරයෙන් අනාගතය ගැන පැවසීම

## ජ්‍යොති ශාස්ත්‍ර, සුනියම්, මන්ත්‍ර, ශරීරය මත කැපීම් හා ලකුණු දෙවියන්වහන්සේ තහනම් කර ඇත

ලෙවී 19 : 26 සහ 28

ඔබ, ලේ සමග කිසිවක් කෑ නොයුතුයි. ශාස්ත්‍ර නොබලන්න; මායම් භාවිතා නොකරන්න; මළවුන් නිසා, ඔබගේ ශරීරයේ කැපුමක් කරනොගන්න; ඔබගේ ශරීරයේ කිසි සායම් ලකුණක්ද කොටා නොගන්න. මම ස්වාමීන්ය.

යෙරෙමියා 27 : 9 ආ

...ඔබලගේ අනාගතවක්තෘන්ටද ඔබලගේ පේන කියන්නන්ටද, ඔබලගේ සිහින කියන්නන්ටද, ඔබලගේ මායම්කාරයන්ටද, ඔබලගේ මන්ත්‍රකාරයන්ටද කන් නොදෙන්න.

මලාකි 3 : 5

...මන්ත්‍රකාරයන්ටද, කාමමිථ්‍යාකයන්ටද, බොරුවට දිවුරන්නන්ටද... විරුද්ධව මම සීඝ්‍ර සාක්ෂිකරුවෙක් වෙමි.

සෙකරියා 10 : 2

රූප නිෂ්ඵල දෙය කථා කළේය; පේන කියන්නෝ බොරු දිටීහ, තවද අසත්‍ය සිහින කියා දුන්හ. ඔවුහු නිෂ්ඵල දෙයෙහි සනසති. එබැවින්, ඔවුහු බැටළුවන් මෙන් ගමන් කරමින්, එඬේරෙක් නැති නිසා දුකට පැමිණෙති.

## සැබෑ එඬේරාව විශ්වාස කරන්න

යොහන් 14 : 1

ඔබලගේ සිත් නොකැලඹේවා; දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න; මා කෙරෙහිද විශ්වාස කරන්න.

### මළවුන් තුළින් පේන කීම

යෙසායා 8 : 19

ඔවුහු කෙඳිරිගාන, තොල් මතුරන ආත්ම බන්ධනාකාරයන්ගෙන්ද, කොඩිවිනකාරයන්ගෙන්ද සොයන්නැයි ඔබලාට කී විට, සෙනඟක් විසින් සිය දෙවියන් වහන්සේගෙන් සෙවිය යුතු නොවේද? ජීවතුන් උදෙසා මළවුන් විචාරන්ට යුතුදැයි අසන්න.

### ශරීරික අවයවයන් හා රූප භාවිතාව

එසකියෙල් 21 : 21

බැබිලෝනියේ රජ පේන ඇසීමට මාර්ගය බෙදෙන දෙමංසන්ධියේ සිට, ඊ ගස් සොලවා, රූපවලින් විභාගකර, අක්මාව බැලුවේය.

### සැරයැටි තුළින් පේන කීම

මාගේ සෙනඟ සිය දන්ඩෙන් විභාග කරති; ඔවුන්ගේ සැරයැටිද ඔවුන්ට දන්වයි. මක්නිසාද, වෛශ්‍යා ආත්මය ඔවුන්ව මුළා කළේය, සිය දෙවියන්වහන්සේගෙන් වෙන්ව ගිය ඔවුහු, වෛශ්‍යාකම් කළහ. —හොෂෙයා 4 : 12

### පේන කී විට දඬුවම

ස්වාමින්වහන්සේගේ වචනය ඉෂ්ට නොකර ස්වාමින්වහන්සේට විරුද්ධව කළ වරද නිසා හා ස්වාමින්වහන්සේගෙන් නොවිචාරා, ආත්ම බන්ධනාකාරියෙකුගෙන් කරුණු විචාල නිසා සාවුල් නැසුණේය. —1 ලේකම් 10 : 13

දර්ශනකාරයන් ලැජ්ජාවටත්, පේන කියන්නන් වියවුල්කමටත් පැමිණෙති. දෙවියන්වහන්සේගෙන් උත්තරයක් නැත. —මීකා 3 : 7 අ

# ලෝ අධිපති ක්‍රියා කරන ක්‍රම

## මිථ්‍යා ජාතීන් ජ්‍යොති ශාස්ත්‍රය විශ්වාස කරති

ස්වාමින්වහන්සේ මෙසේ කියති: ජාතීන්ගේ මාර්ග ඉගෙන නොගන්න, අහසේ ලකුණුවලට ජාතීන් කැළැඹෙන නුමුත්, ඔබලා ඒවාට නොකැළැඹෙන්න.
—යෙරෙමියා 10 : 2

"වාසනාව" උදෙසා අකුරු හෝ ද්‍රව්‍ය විශ්වාස නොකරන්න. යක්ෂා සංගීතයට හෝ නීච පිංතූරුවලට අවනත නොවෙන්න. **"මාගේ නෙත් ඉදිරියේ කිසි නීච දෙයක් තබානොගනිමි"** (ගීතාවලිය 101 : 3).

ආඩම්බරය, වංචාව හා මිථ්‍යා ධර්මද මලානික ආගම්ද අත්හරින්න.

...වංචාකාර වූ නුඹලාට දුක අත්වෙයි! ඒවා පිටතින් ලස්සනට පෙනෙන මුත්, ඇතුළත...සියලු අපවිත්‍රකමින් පිරී තිබේ. එලෙසම නුඹලාත් මනුෂ්‍යයන්ට පිටතින් ධර්මිෂ්ඨව පෙනෙන්නෝය; නුමුත් ඇතුලතින් වංචාවෙන්ද, අයුක්තියෙන්ද පිරී සිටිති.
—මතෙව් 23 : 27, 28

## දිවිහානි කරගැනීම යක්ෂයාගෙන්ය

සිය දිවිහානි කරගැනීමෙන්, තම ප්‍රශ්න ගැටළු හා අපරාධවලින් මිදීමට හැකි බව කියන යක්ෂයාගේ බොරු විශ්වාස නොකරන්න. **මිනී නොමරන්න** (නික්මයාම 20 : 13).

## අපරාධයෙන් මුදවන්නේ ක්‍රිස්තුස් වහන්සේ පමණය

(පිටු 48 සහ 49 බලන්න)

මාගේ ශක්තියද, ගීතිකාවද ස්වාමින්-වහන්සේය, උන්වහන්සේ මාගේ ගැළවීම වූසේක. උන්වහන්සේ මාගේ දෙවියන්-වහන්සේය; උන්වහන්සේව උසස් කරන්නෙමි.
—නික්මයාම 15 : 2

### බොරු අනාගතවක්තෘන් තුළින්

එවිට ස්වාමීන්වහන්සේ මට මෙසේ කීසේක: අනාගතවක්තෘන් මාගේ නාමයෙන් බොරු අනාගතවාක්‍ය කියති. මා ඔවුන්ව එව්වේවත්, ඔවුන්ට අණ කළේවත්, ඔවුන්ට කථා කළේවත් නැත. ඔවුන් ඔබලාට බොරු දර්ශනයක්ද, ජේනකීමද, හිස්කමද, සිය අත්වල වංචාවද අනාබසින් කියති.
—යෙරෙමියා 14 : 14

බොරු ක්‍රිස්තුවරුද, බොරු අනාගතවක්තෘද නැගිට, පුළුවන් නම් තෝරාගත් අය මුළා කරන පිණිස, ලකුණු හා පුදුම දෙයද පෙන්වති. —මාර්ක් 13 : 22

### මළවුන් හා කථා කිරීමෙන්

දේව අනුග්‍රහයෙන් දවිත් රජ සිය පුතණුවන් ගැන මෙසේ කීය: **දන් ඔහු මා වෙත නොඑන්නේය** — 2 සාමුවෙල් 12 : 23

අශුද්ධාත්ම හා කථා නොකරන්න. ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් ඔවුන්ව එලවා හරින්න. ශාස්ත්‍ර, දදු දෑම්ම, සූනියම්, මන්ත්‍ර, බන්ධන හා කොඩිවින විශ්වාස නොකරන්න. **"එහෙත් ජය පැමිණෙන්නේ ස්වාමීන්වහන්සේගෙන්ය"** (හිතෝපදේශ 21 : 31 ආ).

### රූප හා සාතන්ගේ පොත් විනාශ කරන්න

ක්‍රියා 19 : 19, 20

යන්ත්‍රමන්ත්‍ර අභ්‍යාස කළ බොහෝ දෙනෙක් සිය පොත් එකතුකර ගෙනවිත් සියල්ලන් ඉදිරියේ දී පුළුස්සා දැමුහ; ඒවායේ මිළ ගණන් බලා, රිදී මිළ පනස් දහසක් බව දැනගත්හ. එපමණ බලගතු ලෙස ස්වාමීන්වහන්සේගේ වචනය වර්ධනය වී බලවත් විය.

# ක්‍රිස්තුස්වහන්සේ ලිංගභේදය මැවූහ සාතන් එය දුරාචරාය කරන්නේය

**ලිංගභේදය විවාහයට පමණක් මවා ඇත**

උත්පත්ති 2 : 22 සහ 24

ස්වාමිවූ දෙවියන්වහන්සේ මනුෂ්‍යයාගෙන් ගත් ඉළ ඇටයෙන් ස්ත්‍රිය සාද, ඇය මනුෂ්‍යයා වෙත ගෙනාසේක. එබැවින් පුරුෂයා, සිය පියා සහ මව අත්හැර තම භායර්‍යාවට ඇලුම් වෙයි; ඔවුහු එක මාංසයක් වෙති.

හෙබ්‍රෙව් 13 : 4

විවාහය සියල්ලන් අතරේ ගෞරවයෙන්ද, යහන නොකිලුටුවද තිබේවා. මක්නිසාද, වෛශ්‍යාකම් හා කාමමිථ්‍යාචාරය දෙවියන්වහන්සේ විනිශ්චය කරති.

එපීස 5 : 5

මක්නිසාද, වෛශ්‍යාකම් කරන්නෙකුට හෝ අපවිත්‍ර තැනැත්තෙකුට හෝ... ක්‍රිස්තුස්වහන්සේගේද, දෙවියන්වහන්සේගේද රාජ්‍යයේ කිසි උරුමයක් නොලැබෙයි.

1 කොරින්ති 7 : 10, 11

විවාහ වූ අයට මම ආඥා කරමි; එහෙත් ආඥා කරන්නේ මා නොව ස්වාමින් වහන්සේය. එනම්: භායර්‍යාව පුරුෂයාගෙන් වෙන් නොවේවා (නුමුත් ඇ වෙන්ව ගියා නම්, විවාහ නොවී සිටිවා නැතහොත් ඇගේ පුරුෂයා හා සමගි වෙත්වා); පුරුෂයාද සිය භායර්‍යාව අත්නොහරීවා.

**අකීකරුකම පිටුපස සාතන් ඇත**

1 යොහන් 3 : 8 අ

පව් කරන තැනැත්තා යක්ෂයාගෙන්ය; මක්නිසාද, යක්ෂයා පටන්ගැන්මේ සිට පව් කරන්නේය....

**ඔබ කීකරුවන තැනැත්තාට ඔබ අයිතිය**

# කාමමිථ්‍යාචාරය හා වෛශ්‍යාකම දෙවියන්වහන්සේට විරුද්ධව කැරලිගැසීමකි

ඔබ වෛශ්‍යාකම් නොකළ යුතුයි.

—නික්මයාම 20 : 14

දෙවියන්වහන්සේගේ කැමැත්ත-ඔබලා ශුද්ධව සිටීමයි. ඔබලා කාමමිථ්‍යාචාරයෙන් වැලකී සිටිය යුතුයි.

—1 තෙසලෝනික 4 : 3

අන් මිනිසෙකුගේ බිරිඳ හා වෛශ්‍යාකම් කරන්නෙක්, එනම්: සිය අසල්වැසියාගේ බිරිඳ හා වෛශ්‍යාකම් කරන්නෙක් සිටීද, එසේ කරන්නාද, කරන්නීද සැබැවින්ම මරනු ලැබිය යුතුය. —ලෙවී 20 : 10

### සිය ශරීරයට විරුද්ධව ඇති පාපය

ශරීරය කාමමිථ්‍යාචාරය පිණිස නොව, නුමුත් සවාමින්වහන්සේ උදෙසාය; සවාමින්වහන්සේද ශරීරය උදෙසාය... ඔබලගේ ශරීර ක්‍රිස්තුස්වහන්සේගේ අවයවයන් බව දන්නේ නැද්ද?... කාමමිථ්‍යාචාරයෙන් පලා දුවන්න. මිනිසා කරන සියලු පව් ශරීරයෙන් පිටතටය; නුමුත් කාමමිථ්‍යාචාරය කරන්නා සිය ශරීරයට විරුද්ධව පව් කරයි.

—1 කොරින්ති 6 : 13 ආ, 15 අ සහ 18

### ලිංගික පාපයෙන්, දෙමාපියන් ආරක්ෂාකර ගත යුතුයි

දේශය වෛශ්‍යාකමට වැටී දූෂ්‍යකමින් නොපිරෙන පිණිස, ඔබේ දුව වෛශ්‍යාකමට දී අපවිත්‍ර නොකරන්න. —ලෙවී 19 : 29

**කාමමිථ්‍යාචාරය** - අවිවාහකයන් අතර මෛථුන සේවනය.

**වෛශ්‍යාකම** - විවාහ වූ අය සිය විවාහ සහකාරිය හෝ සහකාරයාගෙන් පිට, අන් අය හා මෛථුන සේවනයේ යෙදීම.

# ක්‍රිස්තුස්වහන්සේගේ මරණින් සාතන් පරාජය විය

1 කොරින්ති 15 : 22

ආදම් තුළ සියල්ලෝම මැරෙන්නාක් සේ, ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත්කරනු ලබති.

හෙබ්‍රෙව් 2 : 14, 15

එහෙයින් දරුවන් ලේ හා මාංසයට සහකාරයන් වී සිටින නිසා, උන්වහන්සේ එම ආකාරයෙන් ඒවාට සහකාරයෙක් වූහ එසේ කළේ, මරණය කෙරෙහි බලය ඇති යක්ෂයාව, මරණය තුළින් බල විනාශකර, ජීවිතය මුළුල්ලේ මරණයට භයින්, වහල්කමට යටත්ව සිටි සියල්ලන් නිදහස් කරන පිණිසය.

1 යොහන් 3 : 8 ආ

දෙවියන්වහන්සේගේ පුත්‍රයාව ප්‍රකාශ කළේ මේ පිණිසය, එනම්: යක්ෂයාගේ ක්‍රියා විනාශ කරන පිණිසය.

කොලොස්සි 2 : 15

උන්වහන්සේ, අධිපතීන් හා බලයලත් අය පහකර, ඔවුන්ව ප්‍රසිද්ධියේ පෙන්වා, කුරුසිය තුළින් ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශ කළසේක.

**ක්‍රිස්තුස් තුළ අපට අමරණීයත්වය**

2 තිමෝති 1 : 9, 10

උන්වහන්සේ, අපේ ක්‍රියාවල ප්‍රකාරයට නොව, සිය අභිප්‍රායෙද, ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ පූර්ව කාලවලට ප්‍රථමයෙන් අපට දෙන ලද කරුණාවේද ප්‍රකාරයට අප ගළවා, ශුද්ධ කැඳවීමකින් කැඳවාගත්සේක. මරණය නැතිකර, ජීවනයත්, අමරණීයත්වයත්, ශුභාරංචිය තුළින් එළිදරව් කළ අප ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රකාශ වීමෙන් ඒ කරුණාව දැන් ප්‍රකාශ වී තිබේ.

1 පේත්‍රුස් 5 : 8 ආ, 9 අ

ඔබගේ විරුද්ධකරු වූ යක්ෂයා, ගොරවන සිංහයකු මෙන් කවරෙකු ගිලගනිම්දැයි සොයමින් ඔබ මොබ ඇවිදියි...... ඇදහිල්ලේ ස්ථිරව සිට යක්ෂයාට විරුද්ධව සිටින්න.

එපීස 6 : 11 - 18

යක්ෂයාගේ උපායන්ට විරුද්ධව සිටීමට ඔබට හැකි වන සේ දෙවියන්වහන්සේගේ සියලු යුධායුධ පැළඳගන්න. මක්නිසාද, අපේ පොරබැදීම මාංසයට හා රුධිරයට විරුද්ධව නොව, අධිපතිකම්වලටත්, පරාක්‍රමධාරීන්ටත්, අන්ධකාරයේ වෙසෙන ලෝ පාලකයන්ටත්, උසස් ස්ථානවල සිටින දුෂ්ටකමේ ආත්මයන්ටත් විරුද්ධවය. එබැවින් නපුරු දින විරුද්ධව සිටීමට...ඉහටි සැබෑකම නැමති පටයෙන් බැඳ, ධර්මිෂ්ඨකම නැමති ළයවැස්ම පැළඳ, සාමයේ ශුභාරංචිය නැමති වහන් පය ලා සිටින්න. සියල්ලට ඉහළින්, ඇදහිල්ල නැමති පළිහ ගන්න. එයින් නපුරාගේ සියලු ගිනිහෙල් නිවීමට ඔබට පුළුවන. ගැළවීම නැමති ආරක්ෂක හිස්වැස්මද, දෙවියන්වහන්සේගේ වචනය නැමති ආත්මයානන්ගේ කඩුවද ගන්න. සියලු යාඥාවලින්... සියලු කාලවල දී ආත්මයාණන් තුළ යාඥා කරන්න.

යාකොබ් 4 : 7

එබැවින් දෙවියන්වහන්සේට යටත්ව සිටින්න; නුමුත් යක්ෂයාට විරුද්ධව සිටින්න. එවිට ඔහු ඔබ වෙතින් පලා යනවා ඇත.

1 යොහන් 4 : 4 ආ

...ලෝකයේ සිටින තැනැත්තාට (යක්ෂයා) වඩා ඔබ තුළ සිටින තැනැත්තා (ක්‍රිස්තුස්) උතුම්ය....

ඇයි සාතන් පලා දුවන්නේ: ක්‍රිස්තුස් ඔබ තුළ නිසාය

උන්වහන්සේ දෙවියන්වහන්සේගේ හඬය

හෙබ්‍රෙව් 1 : 1 අ, 2

දෙවියන්වහන්සේ... මෙම අන්තිම දවස්වල දී සිය පුත්‍රයා ලවා අපට කථා කළසේක. උන්වහන්සේව සියල්ලට උරුමක්කාරයා කර උන්වහන්සේ ලවා ලෝකවල් සෑදූසේක.

මාර්ක් 1 : 22

උන්වහන්සේගේ ඉගැන්වීම ගැන ඔවුහු මවිත වූහ. මක්නිසාද, ලියන්නන් මෙන් නොව, නුමුත් බලය ඇති කෙනෙකු සේ ඉගැන්වූ නිසාය.

1 කොරින්ති 8 : 6

නුමුත් අපට ඇත්තේ එක දෙවි කෙනෙක් වන පියාණන්වහන්සේය. සියල්ල උන්වහන්සේගෙන්ය. අපද උන්වහන්සේ උදෙසාය. තවද අපට ඇත්තේ එකම ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. සියල්ල උන්වහන්සේගෙන්ය අපද උන්වහන්සේගෙන්ය.

යොහන් 5 : 27

ඔහු මනුෂ්‍ය පුත්‍රයා බැවින්, විනිශ්චය කිරීමට උන්වහන්සේට බලය දී ඇත.

1 පේත්‍රුස් 3 : 22

උන්වහන්සේ ස්වර්ගයට ගොස් දෙවියන්වහන්සේගේ දකුණු දෙස සිටිනසේක; දේව දූතයෝද, බලය ලද්දෝද, පරාක්‍රමධාරිහුද උන්වහන්සේට යටත් කළ අය වෙති.

රෝම 14 : 9

මක්නිසාද, ක්‍රිස්තුස්වහන්සේ මැරුණේද, නැවත ජීවත් වුණේද, මළවුන්ගේද, ජීවතුන්ගේද ස්වාමින්වහන්සේ වන පිණිසය.

මතෙව් 28 : 18

යේසුස්වහන්සේ පැමිණ කථාකර: ස්වර්ගයේද, පොළොවේද සියලු බලය මට දී තිබේ යයි කීසේක.

# ක්‍රිස්තුස්වහන්සේ බලයෙන් යුතුව කථා කරයි, ක්‍රියා කරයි 

මාර්ක් 4 : 39

උන්වහන්සේ නැගිට සුළඟට තරවටු-කර: නිශ්ශබ්ද වෙව, නිශ්චල වෙවයි මුහුදට කීසේක. එවිට සුළඟ නැවතී මහත් නිශ්චලයක් විය.

**බලයෙන් යුතුව උන්වහන්සේ සුව කළහ**

මාර්ක් 2 : 10-12 අ

පොළොවේ දී පව් කමා කිරීමට මනුෂ්‍යය පුත්‍රයාට බලය ඇති බව ඔබලා විසින් දැනගැනීම පිණිසය කියා, උන්වහන්සේ අංසභාග රෝගියාට කථා කර: නැගිට ඔබ යහන රැගෙන ගෙදර යන්නැයි ඔබට කියමියි කීසේක. එකෙණෙහිම ඔහු නැගිට, යහන රැගෙන සියල්ලන් ඉදිරිපිට පිටත්ව ගියේය. ඒ නිසා සියල්ලෝම මවිත වී... දෙවියන් වහන්සේට ප්‍රසංසා කළහ.

**ක්‍රිස්තුස්වහන්සේ යක්ෂයන් පලවා හරිති**

මාර්ක් 1 : 26, 27

එවිට අශුද්ධාත්ම, ඔහුව තදින් වෙව්ලවා, මහත් හඬින් මොරගසමින් ඔහුගෙන් පිටවිය. එකල ඔවුන්ගේ මවිතය කෙතරම් ද වී යත්, සියල්ලෝම: මේ කිමෙක්ද? මේ කුමන අලුත් ඉගැන්වීමක්ද? උන්වහන්සේ බලයෙන් යුතුව අශුද්ධාත්ම-යන්ට පවා අණ කරනසේක. ඔවුන්ද උන්වහන්සේට කීකරු වෙතියි ඔවුනොවුන් අතරේ කථා වූහ.

**බලයෙන් යුතුව මළවුන් නැගිට්ට වූහ**

...උන්වහන්සේ: යෞවනය, නැගිටින්-නැයි ඔබට කියමියි කීසේක. එවිට මළ ඔහු, නැගිට හිඳ කථා කිරීමට පටන් ගත්තේය —ලූක් 7 : 14 ආ, 15

# සතුරාගේ සියලු බලයට එරෙහිව උන්වහන්සේගේ අනුගාමිකයන්ට ක්‍රිස්තුස්වහන්සේ බලය හා වරය දෙනසේක

ලූක් 10 : 19

බලන්න, සර්පයන්ද, ගෝනුස්සන්ද පෑගීමටත්, සතුරාගේ මුළු ශක්තිය මැඩලන්ටත් මා ඔබලට බලය දී තිබේ.

ලූක් 9 : 1

උන්වහන්සේ දෙළොස් දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද, රෝග සුව කරන්ටද, බලය සහ වරය දුන්සේක...

මාර්ක් 11 : 23

සැබවක් ඔබලට කියමි: කවරෙක් හෝ මෙම කන්දට කථාකර: ඉදිරි මුහුදේ වැටෙන්නැයි කියා තම සිතින් සැක නොකර, තමා කියන දෙය සිදුවේ යයි අදහන්නේ නම්, ඔහු ඒ කී දෙය ඔහුට ලැබෙයි.

යොහන් 14 : 12 අ

සැබවක්, සැබවක්, ඔබට කියමි: මා කෙරෙහි අදහන්නා, මා කරන ක්‍රියාද කරන්නේය.

මාර්ක් 9 : 23

යේසුස්වහන්සේ උත්තර දෙමින්: ඔබට විශ්වාස කිරීමට හැකි නම්, විශ්වාස කරන්නාට සියල්ල පුළුවන්නැයි කීසේක.

එපීස 1 : 19

අදහන අප කෙරෙහි උන්වහන්සේගේ බලයේ මහත්කම කිමෙක්ද කියාත්, ඔබලා දැනගැනීම පිණිස ඔබලගේ නෙත් පහදන පිණිසත්ය.

**ඔවුන්ව යේසුස්වහන්සේගේ නමින් දුෂ්ශකර පිටතට අණ කරන්න**

මාර්ක් 5 : 8, 9 සහ 13 ආ

අශුද්ධාත්මය, මොහුගෙන් පිටතට එවයි, උන්වහන්සේ ඔහුට කීසේක. තවද උන්වහන්සේ නුඹේ නම කුමක්දැයි ඇසූහ. අප බොහෝ දෙනෙක් හෙයින්, මගේ නම ලෙගියොන් යයි ඔහු උත්තර දුන්නේය... අශුද්ධාත්ම පිටතට ගොස් ඌරන්ට වැසුණෝය.

මාර්ක් 9 : 25 ආ-27 සහ 29 ආ

යේසුස්වහන්සේ අශුද්ධාත්මයට තරවටු කර: ගොලු බිහිරි ආත්මය, මොහු කෙරෙන් පහව යව, තවත් මොහුට ආවේශ නොවීමට තට අණ කරමියි කීසේක. එවිට ආත්මය මොරගසා බොහෝ සේ ඔහුව වෙව්ලවමින් පිටතට ආවේය. ඔහු මළ කෙනෙකු මෙන් විය; එමනිසා, ඔහු මැරුණේ යයි බොහෝ දෙනෙකු කීහ. නුමුත් යේසුස්වහන්සේ ඔහුගේ අත ගෙන නැගිට්ට වූහ. එවිට ඔහු නැගිට සිටියේය... යාඥාවෙන් හා නිරහාරයෙන් මිස, වෙන ආකාරයකින්... මෙවැනි දෙය නුපුළුවනැයි...කීසේක.

ක්‍රියා 16 : 18 ආ

පාවුල්... හැරී ආත්මයට කථාකර: යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නමින් ඇගෙන් අහක් වී යැමට නුඹට අණ කරමියි කීවේය. ඒ පැයේදීම ආත්මය අහක්ව ගියේය.

ලූක් 4 : 35

යේසුස්වහන්සේ ඔහුට තරවටු කරමින්: කථා නොකර මොහුගෙන් පිටවෙවයි කීසේක. එවිට යක්ෂයා, සමූහයා මැද ඔහුව බිම හෙලා, ඔහුට හිංසාවක් නොකර, ඔහුගෙන් පිටතට ආවේය.

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහෝත්තම නාමය

පිලිප්පි 2 : 9, 10 අ

දෙවියන්වහන්සේ, උන්වහන්සේව ඉතා උසස් කර, සියලු නාමයන්ට වඩා උසස්ම නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කළේ... සියල්ලන් යේසුස්ගේ නමින් දණ නමන පිණිසය.

යොහන් 14 : 13

පුත්‍රයා තුළ පියාණන් මහිමය ලබන පිණිස, ඔබ මගෙන් ඉල්ලන කුමන දෙයක් වුවත්, එය මම ඉෂ්ට කරමි.

ක්‍රිස්තුස්වහන්සේට සේවය කිරීමෙහි ලා මා බිරිඳ හා පවුල සමග ඇඳගිල්ලෙන්, මම නැවත අප්‍රිකාවට ගියෙමි. එක් රාත්‍රියක දී, දරුණු අශුද්ධාත්මයක් මා පිට සිටිය දී මට අවදිවිය. මෙය සැබවින්මද කියා බැලීමට, මා දණහිස ඔහුගේ දණහිස වෙත ගෙනා කළ, එක්විටම, ඔහු මා දණහිස විශාල ශක්තියකින් පිටුපසට තල්ලුකර, හුස්ම සිරකිරීම පිණිස වේගයෙන් මා බෙල්ල දෙසට ආවේය. **''යේසුනි, මට උදව් කරන්න''** කියා කීමට පමණයි මට හැකි වූයේ. ඒ මොහොතේ දීම ඔහු මා අත්හැර ගියේය. එද සිට අද දක්වා, එවැනි දෙයක් මට තවත් නොවීය. සාතන් හා යක්ෂයන්ව බිය කරවන බලයක් යේසුගේ නාමයෙහි ඇත! ඔබේ ගැලවීම හා මිදීම පිණිස යේසුස් යන නමට අඬගසන්න. (රෝම 10 : 13)

සිය පාසැල් සමයේ දී, තරුණයෙක් ඇවිදීම පිණිස රේල් පාර දිගේ ඇව කැඳවා ගිය බව, එක් මහත්මියක්, මට හා මා බිරිඳට පැවසීය. එක් ස්ථානයක දී, ඔහු ඇයව මැරීමට තැත් කළා. ඔහු අදහස වූයේ, ඇ දුම්රියකට අසු වී මැරුණු බව පෙන්වීමටය. ඇ, යේසුස් ක්‍රිස්තුස්ගේ නමින් ඔහුට අණ කළ විට, ඇය ඉදිරියේ ඔහු දුබල විය. තවද, නැවතත් පාසැලට යන තෙක්, යේසුස්වහන්සේගේ බලයෙන් ඔහුව ඉදිරියෙන් තබා ඇවිද්ද විය.

සිය තරුණවියේ දී, තම කාමරය ශාස්ත්‍ර කණ්ඩායමකට අනුවණකම නිසා දුන් බවද, ඉන්පසු, අශුද්ධාත්ම එහි ගෘහභාණ්ඩ කාමරය තුළ එහා මෙහා කිරීමට පටන් ගත් බවද, ගැලවීමට නොහැකි තැන, යේසුස් යන නමින් ඒ අශුද්ධාත්ම සිය කාමරයෙන් පිටතට පලවා දැමූ බවද, පසුව තමා සම්පූර්ණයෙන් යේසුට කැප වූ බවද, තවත් මහත්මියක් මට හා මා බිරිඳට කියා සිටියාය.

කිසිවිට සාතන්ට හා යක්ෂයන්ට දයානුකම්පා විය නොයුතුයි. දෙවියන්වහන්සේට විරුද්ධව, ඔබව ඔවුන් හා එකඟ කරවීම ඔවුන්ගේ එකම පරමාර්ථයයි. මාංසික දුර්වලත්වයෙන් හා මානසික ව්‍යාකූලත්වයෙන් සිටි වැඩිමහල් ක්‍රිස්තියානියෙකු, සාතන් ඔහුට කී දෙයද, සාතන්ට ''අවස්ථාවක් දීමට'' ඔහු කල්පනා කළ බවද, මට කීය. සාතන් මිනිසා රැවටීමට අති දක්ෂ බවත්, ඔහුගේ එක වචනයක් හෝ පිළිනොගත යුතු බවත් ඔහුට පැවසූ මම, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සර්වබලධාරි නාමයෙන් සාතන්ට තරවටු කෙළෙමි. ''ඔබ අද රාත්‍රියේ ආ නිසා මම සැබවින්ම සතුටු වෙමියි'' හේ කීය. සති කීපයකට පසු ඔහු මළ නුමුත්, එදවස්, ඔහු ක්‍රිස්තුස් වහන්සේ තුළ සාමයෙන් සිටි බව පෙණුනි.

වොට්සන් ගුඩ්මන්

# ක්‍රිස්තුස් හා සාතන්ගේ අසමානකම්

## ක්‍රිස්තුස් මැවුම්කාර දෙවියන්ය

කොලොස්සි 1 : 16

සිංහාසන වේවා, ස්වාමිකම් වේවා, අධිපතිකම් වේවා, බලපරාක්‍රම වේවා, අහසේ සහ පොළොවේ, පෙනෙන හා නොපෙනෙන සියල්ල උන්වහන්සේ විසින්, උන්වහන්සේ උදෙසා මවා තිබේ.

## ක්‍රිස්තුස් ආලෝකය හා සාමය දෙනසේක

ලූක් 1 : 79

...අඳුරේ හා මරණ සෙවණේ සිටින අයට එළිය දෙන පිණිසත්, අප පාද, සාමයේ මාර්ගයට පමුණුවන පිණිසත්ය.

2 තෙසලෝනික 3 : 16 අ

සාමයේ ස්වාමීන් ඔබලට, නිතර, සියලු ආකාරයෙන් සාමය දෙත්වා.

## සාතන් හා යක්ෂයන් විනාශ කරති

සොරා එන්නේ, සොරකම් කිරීමටත්, මැරීමටත්, විනාශ කිරීමටත් පමණය....
—යොහන් 10 : 10 අ

පොළොවට... දුක් ඇති වෙයි! මක්නිසාද, තමාට ස්වල්ප කාලයක් ඇති බව දත් යක්ෂයා මහත් උදහසකින් ඔබලා වෙත බැස ආවේය. —එළිදරව් 12 : 12 ආ

## සාතන් අඳුර හා වධහිංසා ගෙන දෙයි

දුෂ්ටයන්ගේ මග අන්ධකාරය මෙන්ය, ඔවුන් කුමකින් පැකිලෙයිද යත් ඔවුහුම නොදනිති. —හිතෝපදේශ 4 : 19

...ධනවතාද නැසී, තැන්පත් කරන ලදී. ඔහු පාතාලයේ (අපායේ) වධවිඳිමින් ඇස් එසවිය. —ලූක් 16 : 22 ආ, 23 අ

## ක්‍රිස්තුස් සත්‍යයය

යොහන් 1 : 14 සහ 8 : 31 ආ, 32

වාක්‍යාණෝ මාංසවත් වී, කරුණාවෙන්ද, සත්‍යයෙන්ද පූර්ණව අප අතරේ වාසය කළසේක. පියාණන් වෙතින් වූ ඒකජාතක පුත්‍රයාණන්ගේ මහිමය වැනි උන්වහන්සේගේ මහිමය දිටිමුව : ඔබලා මාගේ වචනයේ පවතින්නෙහි නම්, සැබවින්ම ඔබලා මගේ ගෝලයන්ය; ඔබලා සැබෑව දැනගන්නේය. සැබෑවද ඔබලව නිදහස් කරන්නේය.

## ක්‍රිස්තුස් ප්‍රෙමයෙන් පිරිලාය

1 යොහන් 3 : 16

අප ප්‍රෙමය දැනගෙන තිබෙනුයේ, ඒ තැනන්වහන්සේ සිය ප්‍රාණය අප උදෙසා දුන් හෙයිනි. අප සහෝදරයන් උදෙසා අප ජීවිත දීමට යුතුය.

## සාතන් බොරුවේ පියාය

යොහන් 8 : 44

නුඹලා, නුඹලගේ පිය වූ යක්ෂයාගෙන්ය; නුඹලා නුඹලගේ පියාගේ තෘෂ්ණාවන් ඉෂ්ට කිරීමට කැමතිය. ඔහු පටන්ගැන්මේ සිට මිනිමරන්නෙක්ය. ඔහු තුළ සැබෑව නැති හෙයින් ඔහු සැබෑව තුළ නොපැවතුණේය. ඔහු බොරුවක් කියන කළ තමාගේ දෙය කියයි. මක්නිසාද ඔහු බොරුකාරයෙක්ය, බොරුවේ පියාය.

## සාතන් වෛරය පොළඹවයි

යොහන් 15 : 18

ලෝකයා ඔබට වෛර වෙනවා නම්, ඔබට පළමුව මට වෛර වූ බව ඔබ දන්නේය.

ගලාති 5 : 19 අ, 20

මාංසයේ ක්‍රියා නම්...... සතුරුකම (වෛරය)......ක්‍රෝධය......යන මේවාය.

# ක්‍රිස්තුස් සහ සාතන්ගේ අසමානකම් 

### ක්‍රිස්තුස් ආත්මය පිරිසිදු කරති

උන්වහන්සේ ආලෝකයේ සිටිනා සේ අපිත් ආලෝකයේ හැසිරෙමු නම්, අපට එකිනෙකා හා යංගුකාරකම ඇත. උන්වහන්සේගේ පුත්‍ර වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ලෙයද, සියලු පාපවලින් අපව පිරිසිදු කරයි. —1 යොහන් 1 : 7

### ක්‍රිස්තුස් පාපයෙන් ගලවති

ඊටත් වඩා, ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය තුළින් ධර්මිෂ්ඨකරනු ලැබූ අපි, උන්වහන්සේ නිසා දෙවියන්වහන්සේගේ උදහසින් ගළවනු ලබන්නෙමු.

—රෝම 5 : 9

### ක්‍රිස්තුස් සදකාල ජීවනය දෙති

යොහන් 17 : 3

සදකාල ජීවනය නම් මෙයයි - එකම සැබෑ දෙවියන්වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවූ තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් අඳුනාගැනීමය.

### සාතන් ආත්මය අපිරිසිදු කරයි

නොරැවටෙල්ලා, දෙවියන්වහන්සේට සරදම් කිරීමට කිසිවෙකුට නුපුළුවන. මක්නිසාද, මනුෂ්‍යයෙක් වපුරන දෙයම ඔහු කපාගනියි. එබැවින්, සිය මාංසය සඳහා වපුරන්නා, මාංසයෙන් කුණුවීම කපාගනියි. —ගලාති 6 : 7, 8 අ

### සාතන් මිනිසාව පාපයට පොළඹවයි

පව් කරන තැනැත්තා යක්ෂයාගෙන්ය; මක්නිසාද, යක්ෂයා පටන්ගැන්මේ සිට පව් කරන්නේය.... —1 යොහන් 3 : 8 අ

### සාතන් සදකාල අපායට මග පෙන්වයි

කිරිඳි නම් නපුරගේ දරුවන්ය. ඒවා වැපුරූ සතුරා, යක්ෂයාය... කිරිඳි එකතු කර ගින්නෙන් දවනු ලැබේ.

—මතෙව් 13 : 39 - 40 අ

# සාතන් සහ ලෝ පාලනය

## දැන් ඔහු ලෝ අධිපතිය

ඔබලා සමග මම (යේසුස්) වැඩිපුර කථා නොකරමි. මක්නිසාද ලෝ අධිපතියා පැමිණෙන්නේය. නුමුත් ඔහුට මා තුළ කිසිවක් නැත. - යොහන් 14 : 30

## සාතන් අධිපතිය. කාරණා වරදින විට ඔහුට දෙස් පවරන්න

ඒ ප්‍රඥාව ඉහලින් පැමිණියේ නැත; නුමුත් භූමිකව, මාංසිකව, යක්ෂාකාරව තිබේ. මක්නිසාද, ඊර්ෂ්‍යාවත්, පක්ෂවාදි-කමත් ඇති තැන, අවුල්කමත්, සියලු නපුරු ක්‍රියාවත් ඇත. -යාකොබ් 3 : 15, 16

**සාතන් අවස්ථාව ලත් සැණින්, ක්‍රිස්තුස් වහන්සේව ප්‍රසිද්ධියේ නමස්කාර කිරී-මෙහි ලා ඇති නිදහස විනාශ කරයි. නුමුත්, ක්‍රිස්තුස්වහන්සේට ඔබ හද ආදරය විනාශ කිරීමට ඔහුට නුපුළුවන. ඇදහිල්ලේ පවතින්න!**

## මරණය තෙක් ක්‍රිස්තුට විශ්වාසව සිටින්න

ක්‍රියා 7 : 59, 60

ස්වාමිවූ යේසුස්වහන්ස, මාගේ ආත්මය පිළිගත මැනව කියා ස්තේපන් යාඥා කරනා කළ, ඔවුහු ඔහුට ගල් ගැසුහ. ඔහු දණින් වැටී: ස්වාමිනි, මෙම පාපය ඔවුන් පිට නොතැබුව මැනවයි මහත් හඩින් මොරගසා කීය. ඔහු එසේ කියා සැතපුණේය.

## ක්‍රිස්තුස්ගේ ලෝ ආණ්ඩුව

යෙසායා 9 : 7 අ

මෙතැන් සිට සදාකාලයටම දවිත්ගේ සිංහාසනයත්, ඔහුගේ රාජ්‍යයත් යුක්ති-යෙන්ද, ධර්මිෂ්ඨකමෙන්ද ස්ථිරකර පිහිටු වන පිණිස, ඒවා කෙරෙහි උන්-වහන්සේගේ ආණ්ඩුවේ විශාලත්වයටත්, සමාදානයටත් අවසානයක් නොවන්නේය.

## සාතන් විසින් බලවත් කළ පාපයේ මිනිසා

2 තෙසලෝනික 2 : 1, 2 ආ, 3,4, 8-9

සහෝදරයෙනි, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඊමද, උන්වහන්සේ වෙත අප රැස්වීම ගැනද... අපි ඔබලාගෙන් හුදෙක්ම ඉල්ලමුව. කිසිවෙකුට කිසිසේත් ඔබලව රැවටීමට ඉඩ නොදෙන්න. මක්නිසාද, ඇදහිල්ලෙන් වැටීම හා විනාශයේ පුත්‍රයා වන පාපයේ මිනිසා එළිදරව් වීම, පළමුව සිදුවුවහොත් මිස, එවැන්නක් නොපැමිණෙයි. දෙවියන් වහන්සේගේ යයි කියන හෝ නමස්කාර කරනු ලබන සියල්ලන්ට ඔහු විරුද්ධව සිට, තමාව උසස් කරගෙන ඔහු දෙවියන් වහන්සේ මෙන් දේවමාළිගාවේ වාඩි වී, තමා දෙවියන්වහන්සේ බව පෙන්වයි... එවිට නොපනත් කරන්නා එළිදරව් වේ. ස්වාමිවූ යේසුස්වහන්සේ තම මුඛයේ හුස්මෙන් ඔහු නසා, සිය ඊමේ ප්‍රකාශවීමෙන් විනාශ කරනසේක. ඔහුගේ ඊම සාතන්ගේ ක්‍රියා කිරීමේ හැටියට බලයෙන්ද, ලකුණුවලින්ද, රැවටිලිකාර හාස්කම්වලින්ද යුක්තය.

එළිදරව් 13 : 2 ආ සහ 7 ආ

...මහා සර්පයා (සාතන්) සිය පරාක්‍රමයත්, සිය ආසනයත්, මහත් බලයත්, ඌට දුන්නේය...සියලු ගෝත්‍රයන්ද...භාෂාවන්ද ජාතීන් ද කෙරෙහි ඌට බලය දෙන ලදි.

එළිදරව් 13 : 4

මහා සර්පයා මෘර්ගයාට බලය දුන් නිසා, ඔවුහු මහා සර්පයාට නමස්කාර කළහ; ඔවුහු මෘගයාටත් නමස්කාර කර: මෘගයාට සමාන කවුද? ඌ සමග යුද්ධ කිරීමට හැකි කාටදැයි කීහ.

දනියෙල් 7 : 25, 26

ඔහු මහෝත්තමයාණන්ට විරුද්ධව මහත් කරුණු කියා, මහෝත්තමයාණන්ගේ ශුද්ධවන්තයන්ට පීඩා කරයි. ඔහු කාලය හා ව්‍යවස්ථාව වෙනස් කිරීමට සිතයි; කාලයකටද, කාලවලටද, කාල භාගයකටද, ඔවුන්ව ඔහු අතට භාරදෙනු ලබයි. එහෙත් විනිශ්චයකාර සභාව හිඳගන්නවා ඇත. එවිට ඔවුන් ඔහුගේ ආණ්ඩුව නාස්ති කිරීමටත්, එහි තීන්දුව නැති කර දැමීමටත්, එය පහකරනවා ඇත.

එළිදරව් 13 : 5 ආ - 9

...මාස හතළිස් දෙකක් පවතින්ට ඌට බලය දෙන ලදි. එකල ඌ, දෙවියන් වහන්සේට විරුද්ධව අපහාස කරන පිණිසද උන්වහන්සේගේ නාමයට හා උන්වහන්සේගේ මණ්ඩපයටත්, එනම්, ස්වර්ගයේ වාසය කරන්නන්ටත් අපහාස කරන පිණිසද මුඛය ඇරීය. තවද ශුද්ධවන්තයන්ට විරුද්ධව යුද්ධ කිරීමටද ඔවුන්ගෙන් ජයගන්ටද ඌට ඉඩ දෙන ලදි. සියලු ගෝත්‍රයන්ද, භාෂාවන්ද, ජාතීන්ද කෙරෙහි ඌට බලය දෙන ලදි. ලෝ පටන්ගැන්මේ සිට මරණ ලද බැටළු පැටවාණන්ගේ ජීවන පොතෙහි නාම ලියවී නොතිබුණු පොළොවේ වසන සියල්ලෝ ඌට නමස්කාර කරන්නෝය. යමෙකුට කන් ඇද්ද, ඔහු අසත්වා.

1 තිමෝති 6 : 12

ඇදහිල්ලේ යහපත් සටනින් සටන් කර සදකාල ජීවනය අල්ලාගත්හ; ඊට ඔබවත් කැඳවා බොහෝ සාක්ෂිකරුන් ඉදිරියේ යහපත් ඇදහිල්ල ප්‍රකාශ කළෙහිය.

# කිසිකලෙක අන්තක්‍රිස්තුගේ රූපය නමස්කාර නොකරන්න

**ලොව රැවටීමට, ලෝ ආගමික නායකයා අන්තක්‍රිස්තුට සහාය දෙයි. වඳින්න නැතහොත් නැසෙන්න!**

එළිදරව් 13 : 14, 15 සහ 19 : 20

කඩුපහර ලැබිලත් ජීවත්වන මෘගයාට රූපයක් සෑදීමට ඕනෑ යයි පොළොවේ වැසියන්ට කියමින්. මෘගයා ඉදිරියේ කළ හාස්කම්වලින් ඌ පොළොවේ වැසියන් මුළා කළේය. මෘගයාගේ රූපය කථා කිරීමටත්, මෘගයාගේ රූපයට නමස්කාර නොකරන සියල්ලන් නැසීමටත් මෘගයාගේ රූපයට පණ දීමටත් ඌට බලය තිබුණේය...එකල, මෘගයාවද, ඌ ඉදිරියේ ඒ හාස්කම් කර, උගේ සළකුණ ලැබුවන් හා උගේ රූපයට නමස්කාර කළවුන් රැවටූ බොරු අනාගතවක්තෘවද අල්ලන ලදි. ඔවුන් දෙදෙනාවම ගෙන්දගම්න් දැවෙන ගිනිවලට පණපිටින්ම හෙළීය.

**දේව දරුවන් අන්‍ය දෙවිදේවතා ප්‍රතික්ෂේප කරති**

දනියෙල් 3 : 17 , 18

ඇවිලෙන ගිනිඋදුනෙන් ගලවන්ට, අප සේවය කරන අපේ දෙවියන්වහන්සේට පුළුවන; රජුරුවෙනි, උන්වහන්සේ ඔබ අතින් අප ගළවනසේක. අහෝ රජුරුවෙනි එසේ නොකළත්, ඔබගේ දෙවිවරුන්ට අප සේවය කරන්නේවත්, ඔබ පිහිටා ඇති රන් රූපයට නමස්කාර කරන්නේවත් නැති බව ඔබ දැනගත මැනවයි කීහ.

# අන්තක්‍රිස්තු: යටත්වෙන්න නැතහොත් හාමතේ ඉන්න

එළිදරව් 13 : 16 - 18

තවද, ලොකු කුඩා, පොහොසත් දුළිඳු, දස නිර්දස යන සියල්ලන්ට සිය දකුණත හෝ නළලේ ලකුණක් ලැබීමටත් ඒ ලකුණ වන මෘගයාගේ නාමය හෝ උගේ නාමයේ ගණන ඇත්තාට මිස, අන් කිසිවෙකුට මිළයට ගැනීමටවත් විකිණීමටවත් බැරිවන සේ සළස්වයි. මෙහි ප්‍රඥව ඇත. ඥානවන්තයින් මෘගයාගේ ලකුණ ගණන් කරත්වා; මක්නිසාද, එය මනුෂ්‍යයෙකුගේ ගණනකි. උගේ ගණන: හයසිය හැට හයය (666).

**ගැලවුන අයට යහපත් දවසක් පැමිණෙයි**

එළිදරව් 7 : 14 ආ - 17

ඔවුහු මහත් පීඩා මැදින් ආ අය වෙති. ඔවුහු සිය සළු, බැටළුපැටවාණන්ගේ ලෙයින් සෝද සුදුකර ගත්තෝය. එබැවින් ඔවුහු දෙවියන්වහන්සේගේ සිංහාසනය ඉදිරියේ සිටිති; උන්වහන්සේගේ මාළිගයේ රෑ දවල් උන්වහන්සේට සේවය කරති. සිංහාසනයේ වැඩහිඳින තැනන්වහන්සේ සිය මණ්ඩපය ඔවුන් ඉහළින් විහිදුවන සේක. ඔවුන් තවත් කුසගිනි හෝ පිපාසය හෝ නොවෙති; සූර්යා රශ්මිය හෝ වෙන උෂ්ණයක් හෝ ඔවුන්ට පහරදෙන්නේ නැත. එමන්ද, සිංහාසනයේ මැද සිටින බැටළුපැටවාණෝ ඔවුන්ගේ එඬේරා වී, ජීවන දිය උල්පත්වලට ඔවුන් ගෙනයනසේක. දෙවිතුමාද ඔවුන්ගේ ඇස්වලින් සියලු කඳුළු පිස දමනසේක.

**පිරුණු කුසක් ඇතිව අපාගත වීමට වඩා කුසගින්නේ ස්වර්ගයට යැම යහපත්ය.**

# අන්තක්‍රිස්තුව නමස්කාර කරන්නන් හා මිළයට ගැනීමට හෝ විකිණීමට ඔහුගේ ලකුණ සිය ශරීරය මත ගන්නෝ විනාශ වෙති

එළිදරව් 14 : 9 - 13

තෙවන දේව දූතයා ඔවුන් පසුපස ගොස්: යමෙක් මෘගයාට හා උගේ රූපයට නමස්කාර කර, තම නළලේවත්, සුරතේවත් ලකුණක් ලබයිද,

දෙවියන්වහන්සේගේ කෝපය නැමති කුසලානට අමිශ්‍රව වත්කරන ලද උන්වහන්සේගේ උදහස නැමති මුද්‍රිකපානය ඔහු බොන්නේය; ශුද්ධ වූ දේවදූතයන් ඉදිරියේද, බැටළුපැටවාණන් ඉදිරියේද, ගින්නෙන් හා ගෙන්දගමින් ඔහුට වධ දෙනු ලැබේ.

ඔවුන්ගේ වේදනාව නැමති ධූමය සදහටම නගින්නේය; මෘගයාටත් උගේ රූපයටත් නමස්කාර කරන්නෝද, උගේ නාමයේ ලකුණ ලබන්නාද, දිවා රෑ දෙකේම නිවාඩු නොලබන්නෝ යයි මහත් හඬින් කීය.

මෙහි දෙවියන්වහන්සේගේ ආඥාද, යේසුස්වහන්සේ කෙරෙහි ඇදහිල්ලද රක්ෂාකරන ශුද්ධවන්තයන්ගේ ඉවසීම ඇත.

තවද: මෙතැන් සිට ස්වාමින් තුළ නසින මළවුන් වාසනාවන්තයෝය කියා ලියන්නැයි ස්වර්ගයෙන් හඬක් මට ඇසිණි. එසේය, ඔවුහු සිය වෙහෙසීම්වලින් නිවාඩු ලබති; ඔවුන්ගේ ක්‍රියාද ඔවුන් සමග යන්නේ යයි ආත්මයාණන් කියනසේක.

# දේව උදහස ලෝ ඒමට ප්‍රථම සාතන්ගේ ලකුණෙන් හා රූපයෙන් ජය



එළිදරව් 15 : 1ආ - 3 සහ 16 : 1

...දේවදූතයන්, සත්දෙනෙක් වසංගත සතක් රැගෙන සිටියහ. දේව උදහස ඒවායේ පිරී තිබුණේය. ගින්නෙන් මිශ්‍ර වූ වීදුරු සයුරක් වැනි දෙයක් සහ මෘගයා-ගෙනුත්, උගේ රූපයෙනුත්, උගේ නමේ ගණනෙනුත් ජයගෙන එන්නන්, දෙවියන් වහන්සේගේ වීණා රැගෙන වීදුරු සයුර අසල සිටිනවා මම දිටිමි. දෙවියන් වහන්සේගේ සේවක මෝසස්ගේ ගීතිකාවද, බැටළුපැටවාණන්ගේ ගීතිකාවද ඔවුහු ගායනා කරමින්: සර්ව පරාක්‍රම ස්වාමි වූ දෙවියන්වහන්ස, ඔබගේ ක්‍රියා මහත්‍ය, විස්මපත්‍ය, ශුද්ධවන්තයින්ගේ රජුනි, ඔබගේ මාර්ග ධර්මිෂ්ඨය, සැබෑය... තවද, ඔබලා ගොස්, දේව උදහස නැමති පාත්‍රා සත පොළොවේ වගුරවන්නැයි දේව දූතයන් සත්දෙනාට කියන මහත් හඬක් දේවමාළිගාවෙන් මට ඇසිණ.

**යේසුස්වහන්සේ නිසා හිස දුන් අය ජීවත්වෙති**

එළිදරව් 20 : 4 ආ

යේසුස්වහන්සේගේ සාක්ෂිය හා දේව වචනය නිසා හිස් කපා දැමූවන්ගේද, මෘගයාටවත්, උගේ රූපයටවත් නමස්කාර නොකළ, උගේ සළකුණ සිය නළලේ හෝ සුරතේ නොලද්දන්ගේද ආත්මයන් දිටිමි; ඔවුහු ජීවත්ව ක්‍රිස්තුස් වහන්සේ සමග අවුරුදු දහසක් රජකම් කළහ.

# හර්මගෙදොන් (ආමගෙඩන්) සටන ක්‍රිස්තුස් නවත්වයි

**යක්ෂයන්, සටන්වැදීම පිණිස ජාතීන් එක්රැස් කරති**

එළිදරව් 16 : 14 සහ 16

ඔවුහු සර්වපරාක්‍රම දෙවියන්වහන්සේගේ මහත් දවසේ, යුද්ධයට මුළු ලොව රජුන් රැස්කරන පිණිස, ඔවුන් ළඟට යන, හාස්කම් කරන යක්ෂ ආත්මයෝය ...ඔවුහු, හෙබ්‍රෙව් භාෂාවෙන්, ආමගෙඩන් කියන ස්ථානයට ඔවුන් රැස්කළහ.

**උන්වහන්සේගේ දේශය සහ තෝරාගත් සෙනඟ වන ඉශ්‍රාලය ක්‍රිස්තුස්වහන්සේ නිදහස් කරති**

සෙකරියා 12 : 2 අ, 3; 14 : 3 සහ 12

බලව, මම යෙරුසලම තැතිගැන්මේ පාත්‍රයක් කරන්නෙමි...... ඒ දවසේදී, මම සියලු ජනයාට යෙරුසලම බරැති ගලක් කරමි; එය උස්සාගන්නා සියල්ලෝ බොහෝ සේ තුවාල ලබති; පොළොවේ සියලු ජාතිහුද එයට විරුද්ධව රැස්වෙති... එවිට ස්වාමින්වහන්සේ පිටත්ව, උන්-වහන්සේ යුද්ධ කළ සටනේ දී මෙන් ඒ ජාතීන්ට විරුද්ධව යුද්ධ කරනවා ඇත... යෙරුසලමට විරුද්ධව යුද්ධයට ආ සියලු ජනයන්ට ස්වාමින්වහන්සේ පමුණුවන පීඩාව මේය: ඔවුන් සිටගෙන සිටියදීම ඔවුන්ගේ මාංසය ක්ෂය වන්නේය. ඔවුන්ගේ ඇස් ඒවායේ සිදුරුවලම ක්ෂය වන්නේය. ඔවුන්ගේ දිවද ඔවුන්ගේ කටේම ක්ෂය වන්නේය.

රෝම 8 : 31 ආ

**.....දෙවියන්වහන්සේ අප සමග නම් අපට විරුද්ධ වන්නේ කවුරුද?**

රෝම 1 : 18

මක්නිසාද, සත්‍යය අධර්මිෂ්ඨකමින් වළක්වන මනුෂ්‍යයන්ගේ සියලු අභක්තියට හා අධර්මිෂ්ඨකමට විරුද්ධව දේව උදහස ස්වර්ගයෙන් එළිදරව් වී තිබේ.

එළිදරව් 19 : 15, 16

ජාතීන්ට පහරදීමට උන්වහන්සේගේ මුඛයෙන් තියුණු කඩුවක් නික්මෙයි. උන්වහන්සේ යදණ්ඩකින් ඔවුන්ව ආණ්ඩු කරනසේක. උන්වහන්සේ සර්වපරාක්‍රම දෙවියන්වහන්සේගේ කෝපයේ උදහස නැමති මුද්‍රිත පැස මඩිනසේක. උන්වහන්සේගේ වස්ත්‍රයේ හා කලවයේ **රජුන්ගේ රජ, ස්වාමින්ගේ ස්වාමින්ය** යන නාමය ලියා තිබේ.

**අන්තක්‍රිස්තු අවුරුදු සුලු ගණනක් පාලනය කරයි. ක්‍රිස්තුස්වහන්සේ මෙහි අවු. 1000 පාලනය කර ඉන්පසු සදහටම රාජ්‍ය කරති.**

එළිදරව් 20 : 6 ආ

ඔවුහු දෙවියන්වහන්සේගේ හා ක්‍රිස්තුස්වහන්සේගේ පූජකයෝය, උන්වහන්සේ සමග අවුරුදු දහසක් රාජ්‍ය කරති.

දනියෙල් 2 : 44 අ

ඒ රජුන්ගේ දවස්වල දී, කිසි කලෙකත් නැති නොවන රාජ්‍යයක්, ස්වර්ගයේ දෙවියන්වහන්සේ පිහිටුවනසේක.

**සියලු ජාතීන් ක්‍රිස්තුස් නම් ස්වාමින්ව නමස්කාර කරති!**

ගීතාවලිය 86 : 9

ස්වාමිනි. ඔබ මැවූ සියලු ජාතීහු ඔබ ඉදිරියට පැමිණ නමස්කාර කරමින්, ඔබගේ නාමයට ගෞරවය කරන්නෝය.

# දෙවියන්වහන්සේට විරුද්ධව කළ සිය සටනින් සාතන් පරදියි

එළිදරව් 12 : 7 - 10

තවද ස්වර්ගයේ යුද්ධයක් විය. මිකායෙල් (මයිකල්) හා ඔහුගේ දූතයන් මහා සර්පයාට විරුද්ධව සටන් කළහ. මහ සර්පයාද, සිය දූතයන්ද සටන්කර ජය නොලද, ඔවුන්ට ස්වර්ගයේ ස්ථානයක් තවත් නොවීය. මුළු ලෝ රවටන්නා වන යක්ෂයා, සාතන් නම් කියන මහා සර්පයා නැමති ඒ පූරාණ සර්පයා පහතට හෙළන ලදි; ඔහුව පොළොවට හෙළන ලදි; ඔහුගේ දූතයෝද ඔහු සමග පොළොවට හෙළන ලදි. එවිට: අපගේ දෙවියන් වහන්සේගේ ගැළවීමද, බලයද, රාජ්‍යයද, තම ක්‍රිස්තුස්වහන්සේගේ ආණ්ඩු බලයද දූන් පැමිණියේය. මක්නිසාද, අපගේ දෙවියන්වහන්සේ ඉදිරිපිට රෑ දවල් අප සහෝදරයන්ට වරද තබන, ඔවුන්ගේ වරද තබන්නාව පහතට හෙළන ලදි.

### මෙම සටනේ දී දිනන ආයුධ

ඔවුහු බැටළුපැටවාණන්ගේ ලෙය නිසාද, සිය සාක්ෂියේ වචනය නිසාද, ඔහුගෙන් ජයගත්හ; ඔවුහු මරණය විඳීමට පවා සිය ජීවිතයට ආදරය නොකර සිටියෝය. —එළිදරව් 12 : 11

### සාතන්ගේ සාදකාලික නියමය

එවිට, දෙවියන්වහන්සේ වෙතින් ස්වර්ගයේ ගිනි බැස ඔවුන් විනාශ කළේය. මෘගයාද, බොරු අනාගතවක්තෘද වසන, ගින්නෙන් හා ගෙන්දගමින් යුත් විලට, ඔවුන්ව මුළා කළ යක්ෂයාව හෙලන ලදි; ඔවුහු සදකාලයටම දිවා රාත්‍රි දෙකෙහිම වධකරනු ලබති.

—එළිදරව් 20 : 9 ආ පහ 10

සදාකාල ස්වර්ගීය සම්පතේ ලුසිපර්ට හිකරුවීමට තිබුණි. නුමුත් ඔහු දෙවියන් වහන්සේගේ රාජ්‍යය පාලනය කිරීමට තැත් කළේය.

### ක්‍රිස්තුස් සමිඳු සදහටම රාජ්‍ය කරති

1 ලේකම් 29 : 11

ස්වාමින්වහන්ස, මහත්තත්වයද, පරාක්‍රමයද, තේජසද, ජයද, මහිමයද අයිති ඔබටය. මක්නිසාද, ස්වර්ගයේත්, පොළොවේත් ඇති සියල්ල ඔබගේය; ස්වාමින්වහන්ස, රාජ්‍යයත් ඔබට අයිතිය; සියල්ල කෙරෙහි හිස මෙන් ඔබ උසස්ව සිටිනසේක.

1 කොරින්ති 15 : 22 - 26

මක්නිසාද, ආදම් තුළ සියල්ලන් මැරෙන්නා සේ, ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත්කරනු ලබති; නුමුත් එක් එක් අය සිය ක්‍රමයෙනි. ක්‍රිස්තුස් වහන්සේ නාඹුල් ඵලයයි; ඉන්පසු ක්‍රිස්තුස් වහන්සේගේ ඊමේදී, උන්වහන්සේගේ අය නැගිටිති. එවිට කෙලවර පැමිණෙයි. උන්වහන්සේ සියලු අධිපතිකම්ද, බලයද, පරාක්‍රමයද, නැති කළ කල උන්වහන්සේ-ගේ රාජ්‍යය පිය වූ දෙවියන්වහන්සේට භාර දෙනසේක. මක්නිසාද, උන්වහන්සේ ගේ සියලු සතුරන් සිය පාද යට දමන තුරු රජකම් කිරීමට වුවමනාය. නැති කරනු ලබන අන්තිම සතුරා - මරණයයි.

එළිදරව් 11 : 15

සත්වෙනි දේවදූතයාද පිම්බේය; එවිට ලෝ අධිපතිකම අප ස්වාමින්වහන්සේටද, සිය ක්‍රිස්තුස්වහන්සේටද විය. උන්-වහන්සේ සදහටම රාජ්‍ය කරනසේකැයි මහත් හඬක් ස්වර්ගයෙන් විය.

# සාතන් හා යක්ෂයන් ඔබ සතුරන්ය

**සාතන් පිරිමි හා පිරිමි අනාචාරයේ හසුරු-වමින්ද, ගජ්සා කිරීමෙන් හා යක්ෂාවේශ යෙන්ද, ශරීරය හා ආත්මය දූෂණය කරයි**

රෝම 1 : 27

...පුරුෂයෝ... ඔවුනොවුන් කෙරෙහි රාගයෙන් මත්ව... සිය වරදවලට සුදුසු වන්දිය තමුන් තුළම ලබති.

හිතෝපදේශ 6 : 16, 17

ස්වාමින්වහන්සේ දුවේශ කරන කාරණා ...තිබේ...නිදෙස් ලෙය වගුරවන අත්....

මතෙව් 12 : 45 අ

එවිට ඔහු ගොස් තමාට වඩා දුෂ්ඨ වූ වෙන ආත්ම සතක් තමා හා ගෙන ඇවිත්, ඇතුල්ව, එහි වාසය කරති. එසේ ඒ මනුෂ්‍යයාගේ පළමු ස්වභාවයට වඩා, අන්තිම ස්වභාවය නපුරු වෙයි.

ජීවමාන දෙවියන්වහන්සේව පමණක් සොයන්න. අනාගතය දැනගැනීමට හෝ සිත් කියවීමට හෝ ශරීරික සුවයට හෝ ආත්මික මග පෙන්වීමට හෝ ''දෙවි දේවතා'' අඬ නොගසන්න.

ඒ සියලුදෙයට පිටුපස සිටිනුයේ දෙවියන්වහන්සේට විරුද්ධව සිටින කැරළි කාර යක්ෂයාය. මනුෂ්‍යයන් තුළින්, සාහිත්‍යය තුළින්, වස්තුව බලාපොරොත්තු තුළින් හා වැරදි ආගම් තුළින් සාතන් ක්‍රියා කරයි. ඔහුගේ ගෙනහැර පෑම්, පළමුව, හාස්කම් සහ ලාභ ප්‍රයෝජනයක් ලෙස පෙනුණත්, ඒවා ඔබව සාතන්ගේ නපුරු වහල්කමට ඇද දමයි. ක්‍රිස්තුස්වහන්සේට පමණක් ඔබව නිදහස් කිරීමට පුළුවන.

දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයට හැර, ඔබව පාලනය කිරීමෙහි ලා වෙන කිසිදු ආත්මයකට භාර නොවෙන්න. බයිබලය සහ යේසු සමිඳුව පමණක් විශ්වාස කරන්න.

# බොහෝ දෙනෙකු පැමිණ බොහෝ දෙනෙකුව රවටති 

**ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය තුළින් කමාවීම, පිරිසිදුකම සහ මිදීම ඉවතලන සියලු ඉගැන්වීම් හා ධර්ම මුසාවාද හා රැවටිලිය**

මතෙව් 24 : 4, 5 සහ 11

යේසුස්වහන්සේ ඔවුන්ට උත්තර දෙමින්: කිසිවෙක් ඔබලව මුළා නොකරන සේ බලාගන්න, මක්නිසාද, බොහෝ දෙනෙක්: මම ක්‍රිස්තුස්ය කියා මාගේ නමින් පැමිණ, බොහෝ දෙනෙකුව මුළා කරති...... නොයෙක් බොරු අනාගත වක්තෘන් නැගිට බොහෝ දෙනෙකුව මුළා කරති.

පිලිප්පි 3 : 18, 19

මා ඔබලට සැමවිට කීවෙමි, දැනුත් අඬමින් කියමි, බොහෝ දෙනෙක් ක්‍රිස්තුස් වහන්සේගේ කුරුසියට සතුරෝව හැසිරෙති. විනාශය ඔවුන්ගේ අවසානයයි; බඩ ඔවුන්ගේ දෙවියෝය....

**කමා වී, කමාව ලබන්න**

මතෙව් 6 : 14

ඔබලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා කරත් නම්, ඔබලගේ ස්වර්ගීය පියාණන්, ඔබලටත් කමා කරනසේක.

**ක්‍රිස්තුස්වහන්සේගේ අනගි ලෙය, මුදයි**

1 පේතෘස් 1 : 18 , 19 සහ 20 ආ

...ඔබලව මුදනු ලැබුවේ, දිරා යන රන් රිදී වැනි දෙය තුළින් නොව, කැලලක් හා පලුද්දක් නැති බැටළු පැටවෙකුගේ ලෙය වැනි වූ, ක්‍රිස්තුස්වහන්සේගේ අනගි ලෙය තුළින් බව ඔබලා දනිති...... දෙවියන් වහන්සේ කෙරෙහි උන්වහන්සේ තුළ අදහන ඔබලා....

# අහෝ, මා වැනි කාලකණ්ණි මිනිසෙක්!

## පාපිෂ්ට ප්‍රතිපත්තියෙන් පාලනය වන

යෙසායා 64 : 6

අපි සියල්ලෝම අපවිත්‍ර දෙයක් සේ සිටිමු; අප සියලු ධර්මිෂ්ඨකම්ද, කිලුටු වස්ත්‍රයක් මෙන්ය. අපි සියල්ලෝම කොළයක් මෙන් පරවෙමුව; අප අයතුකම්ද සුළඟ මෙන් අප පහකරගෙන යයි.

## අකීකරුකමේ ආත්මය මත උදහස

එපීස 2 : 2, 3

පෙර කාලයේ දී ඔබලා මෙලොව ව්‍යවහාරය ලෙසත්, අකීකරුකමේ පුත්‍රයන් තුළ දැන් ක්‍රියා කරන ආත්මය වන ආකාසයේ බලයේ අධිපතියාගේ කැමැත්ත හැටියටත්, ඒවායේ හැසුරුණාහ. ඔවුන් අතරේ අප සියල්ලෝද, වරක් අප මාංසයේ තෘෂ්ණාවල හැසිරෙමින්, ස්වභාවයෙන් අන්‍යයන් සේ, උදහසේ දරුවන් සේ සිටියෙමු.

## ගැළවීම නොලද්දන්ව සාතන් පාලනය කරයි

2 කොරින්ති 4 : 3, 4

අපේ සුභාරංචිය වැසී තිබේ නම්, එය වැසී තිබෙන්නේ විනාශ වෙන්නන්ටය. නොඅදහන ඔවුන් තුළ දෙවියන්වහන්සේගේ ස්වරූපය වූ ක්‍රිස්තුස්වහන්සේගේ තේජසේ සුභාරංචිය ආලෝකය නොබැබළෙන පිණිස, මෙලොව දෙවියා (සාතන්) ඔවුන්ගේ සිත් අන්ධ කළේය.

## ක්‍රිස්තුස්වහන්සේ තුළ ජය ඇත

රෝම 8 : 1

මාංසික ලෙස නොව, නුමුත් ආත්මික ලෙස හැසිරෙමින් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සිටින අයව දැන්, දඬුවමට පත් නොකරනු ලැබේ.

මතෙව් 13 : 38

කෙත නම් ලෝකයයි; හොඳ බීජ නම් රාජ්‍යයේ පුත්‍රයන්ය; කිරිඳි නම් නපුරාගේ පුත්‍රයන්ය.

යොහන් 8 : 44 අ

නුඹලා නුඹලගේ පිය වූ යක්ෂයාගෙන්ය නුඹලා, නුඹලගේ පියාගේ තෘෂ්ණාවන් ඉෂ්ට කරන්නේය.

**ආදම් තුළ දෙවියන්වහන්සේට විරුද්ධව අපි කැරළිගසමුව**

මතෙව් 12 : 30

මා හා නොසිටින්නා මට විරුද්ධය; මා හා රැස් නොවන්නා විසිරී යයි.

**මෙනිසා ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයෙන් අප අලුතින් ඉපදිය යුතුයි**

2 කොරින්ති 5 : 17

යමෙක් ක්‍රිස්තුස්වහන්සේ තුළ සිටී නම්, ඔහු අලුත් මැවීමකි. පරණ දෙය පහව ගියේය, මෙන්න සියල්ල අලුත්ව තිබේ.

යොහන් 10 : 27, 28 අ

මාගේ බැටළුවන්, මාගේ හඬ අසති. මමද ඔවුන් අඳුනමි. ඔවුන් මා පසුපස එති මම ඔවුන්ට සදාකාල ජීවනය දෙමි...

**මෙදූන්, යේසු සමිඳුට භාරවෙන්න**

2 කොරින්ති 6 : 2 අ

මෙන්න පිළිගත යුතු වෙලාව, දැන්ය; මෙන්න, ගැලවීමේ දවස අදය.

1 යොහන් 1 : 9

අප පව් අපි කියා දෙමු නම්, අප පව් කමා කරන්ටත්, සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත්, උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිති.

# ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජය

රෝම 8 : 35 සහ 37

ක්‍රිස්තුස්වහන්සේගේ ආදරයෙන් අපව වෙන් කරන්නේ කවුද? විපතවත්, සිත්-කම්පාවත්, පීඩාවවත්, දුර්භික්ෂයවත්, නිර්වස්ත්‍රකමවත්, උපද්‍රවයවත්, කඩුවවත් අප වෙන් කරන්නේද?... නුමුත්, අපට ආදරය කළ තැනන්වහන්සේ තුළ, අපි මේ සියල්ලේ දී ජය ගත්තෙමුව.

1 යොහන් 5 : 4

දෙවියන්වහන්සේගෙන් උපන් යමක් ඇද්ද, එය ලොව්න් ජයගනියි. අප ඇදහිල්ල ලොව්න් ජයගෙන ඇත.

**ජයගත්තන්ට විපාක දෙනු ලැබේ**

එළිදරව් 2 : 17

ආත්මයාණන් සභාවලට කියන දෙය, කන් ඇත්තෝ අසත්වා. ජයගත්තාට, සැඟවී ඇති මන්නාවලින් දෙන්නෙමි; ලබන්නා මිස වෙන කිසිවෙක් නොදන්නා අලුත් නමක් ලියා තිබෙන සුදු ගලක්ද ඔහුට දෙමි.

එළිදරව් 2 : 26

ජයගන්නා වූ, අවසානය තෙක් මාගේ ක්‍රියා පවත්වන තැනැත්තාට... ජාතීන් කෙරෙහි බලය දෙමි.

**දෙවියන්වහන්සේට ඔබව ඉතා වැදගත්ය කල්වාරිය එය ඔප්පු කරයි! ඔබටත් දෙවියන්වහන්සේව ඉතා වැදගත්ද!**

2 කොරින්ති 3 : 5

අපෙන්ම වූ ලෙස, අප තුළින්ම යමක් යෝජනා කිරීමට අපගේ සමර්ථකමක් නැත. අපගේ සමාර්ථකම දෙවියන්-වහන්සේගෙන්ය.

# සදාකාල සේවය පිණිස ඔබ කැමති කෙනා තෝරාගන්න 

### ක්‍රිස්තුස් හා තේජසින් ප්‍රකාශවෙන්න

කොලොස්සි 3 : 1, 2 සහ 4-6

ඔබලා ක්‍රිස්තුස්වහන්සේ හා නැගිටවනු ලත් නම්, උසස්තැන්හි දෙය සොයන්න. එහි ක්‍රිස්තුස්වහන්සේ, දෙවියන්වහන්සේගේ දකුණත වැඩහිදිනසේක. පොළොවේ තිබෙන දෙය නොව, උසස්තැන්හි තිබෙන දෙය සළකන්න. අප ජීවනය වන ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ වන කල, ඔබලත් උන්වහන්සේ හා තේජසින් ප්‍රකාශ වෙති. එබැවින් පොළොවේ තිබෙන ඔබලගේ අවයවයන්, එනම්: වෛශ්‍යාකමත්, අපිරිසිදුකමත්, කාමරාගයත්, නපුරු තෘෂ්ණාවත් රූපවැදීම වූ තණ්හාවත් නසා දමන්න. මේ දේවල් නිසා දෙවියන්වහන්සේගේ උදහස අකීකරු පුත්‍රයන් මත පැමිණෙයි.

### නැතහොත් සදාකාලිකව සාතන් හා විනාශවෙන්න

මතෙව් 25 : 41

එවිට උන්වහන්සේ වමත සිටින්නන්ට කියනසේක: සාපලත්තෙනි, මාගෙන් පහව යක්ෂයාටත්, ඔහුගේ දූතයන්ටත් සූදනම් කර තිබෙන සදාකාල ගින්නට යත්වා.

ගීතාවලිය 9 : 17

දුෂ්ටයෝ, එසේම දෙවියන්වහන්සේව අමතක කරන සියලු ජාතීන් අපායට හරිනු ලැබේ.

මාර්ක් 9 : 43

ඔබේ අත ඔබට බාධා කරයි නම්, එය කපා දමන්න. දෑත් සහිතව නිරයට, එනම් නොනිවෙන ගින්නට යෑමට වඩා අබ්බගාතව ජීවනයට ඇතුලුවීම ඔබට යහපත්ය.

# ස්වර්ග රාජ්‍ය ඔබටයි

## යටත් වෙන්න

මතෙව් 18 : 2-4

උන්වහන්සේ, කුඩා දරුවෙක් තමන් වෙත කැඳවා, ඔවුන් මැද සිටවා: සැබැවක් ඔබලට කියමි-ඔබලා හැරී, කුඩා දරුවන් සේ නොවූයේ නම්, කිසිසේත් ස්වර්ග රාජ්‍යයට ඇතුල් නොවන්නෝය. එබැවින් මෙම කුඩා දරුවා මෙන් යටත් වන කවුරු නමුත් ස්වර්ග රාජ්‍යයේ උතුම් තැනැත්තා වන්නේය.

## පාපයට පසුතැවිලි වෙන්න

මාර්ක් 1 : 4 සහ 14, 15

යොහන්... වනාන්තරයේ දී බෞතිස්ම කරමින් පව්කමාව පිණිස පසුතැවිල්ලේ බෞතිස්මය ප්‍රකාශ කළේය... යොහන්ව පාවා දුන් පසු, යේසුස්වහන්සේ ගලීලයට පැමිණ දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ සුභාරංචිය දේශනා කරමින්: කාලය සම්පූර්ණ වී ඇත. දෙවියන්වහන්සේගේ රාජ්‍යය ආසන්නය. පසුතැවිලි වී, සුභාරංචිය අදහාගන්නැයි කීසේක.

ලූක් 13 : 3

එසේ නොවේ යයි ඔබලට කියමි. පසුතැවිලි නොවූයේ නම්, ඔබලා සියල්ලෝම එසේම විනාශ වෙති.

ක්‍රියා 3 : 19, 20

එබැවින් ස්වාමින්වහන්සේ ඉදිරියෙන් සැනසිලි කාලයක් පැමිණෙන ලෙසද... ඔබලගේ පාප මකා දමනු ලබන පිණිසද, පසුතැවිලි වී හැරෙන්න.

# ඔබ ගැලවුම්කරු සේ ක්‍රිස්තුස්ව අදම පිළිගන්න

**යේසු ක්‍රිස්තුට ඔබ භාරවෙන්න**

ගීතාවලිය 37 : 5

ඔබ මග සවාමින්ට භාරදෙන්න; උන්වහන්සේ තුළ විශ්වාස කරන්න; එවිට උන්වහන්සේ එය ඉෂ්ට කරති.

යොහන් 3 : 16

දෙවියන්වහන්සේ සිය ඒකජාතක පුත්‍රයා දෙන තරම් ලෝකයාට ආදරය කළසේක. එසේ කළේ, උන්වහන්සේ තුළ අදහාගන්න සියලුදෙන විනාශ නොවී, සදාකාල ජීවනය ලබන පිණිසය.

ක්‍රියා 16 : 31

යේසුස් ක්‍රිස්තුස් සමිඳු තුළ අදහාගන්න, එවිට ඔබද, ඔබ ගෙයි වැසියන්ද ගැළවෙතියි, ඔවුහු කීහ.

**සිය දරුවන් වීමට දෙවියන්වහන්සේ බලය දෙති**

යොහන් 1 : 12 සහ 14 : 27 අ

යම් පමණ දෙනෙක් උන්වහන්සේව පිළිගෙන තිබෙත්ද, එනම් උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහාගෙන තිබෙත්ද, ඔවුන්ට දේව දරුවන් වීමට, උන්වහන්සේ බලය දුන්නාහ... ඔබ සමග සාමය තබමි; මාගේ සාමය මම ඔබට දෙමි.

**ප්‍රසිද්ධියේ ක්‍රිස්තුස්වහන්සේව ප්‍රකාශ කරන්න**

රෝම 10 : 9 - 11

යේසුස්වහන්සේ සවාමින් බව ඔබේ මුඛයෙන් ප්‍රකාශ කරත් නම්, උන්වහන්න්සේව, දෙවියන්වහන්සේ විසින් මළවුන්ගෙන් නැගිට වූ බව සිතින් විශ්වාස කරත් නම්, ඔබව ගලවනු ලැබේ. මක්නිසාද, මිනිසා, ධර්මිෂ්ඨකම පිණිස සිතින් අදහති; ගැළවීම පිණිස මුඛයෙන් ප්‍රකාශ කරති. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන කිසිවෙකු ලැජ්ජා නොවෙතැයි ලියවිල්ල කියයි.

Read booklets online or by App
www.wmp-readonline.org